ජනාධිපති [illegible]
පුස්තකාලය



# ජාතියේ හෙට දවස ගොඩ නැගූ 6 වසර

BKT 0224
26/08/2023

ජනාධිපති ලේකම් කාර්යාලය
27 NOV 2000
පුස්තකාලය

# ජාතියේ හෙට දවස ගොඩ නැගූ 6 වසර

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි

පසුගිය වසර 6 තුළ
දැවැන්ත යුධ වියදම්,
කලාපීය මූල්‍ය අර්බුද,
තෙල් මිල ඉහළ යාම
මධ්‍යයේ
වුව ද . . . . .

"දේශපාලනික දුෂ්කර තත්ත්වයන්,
දැඩිවූ සිවිල් යුද්ධය සහ ලෝක මූදල්
වෙළඳපොළේ අර්බුදකාරී තත්ත්වයන්
මධ්‍යයේ වුව ද ඉකුත් කාලය තුළ දී
ඒවාට මුහුණ දී හිස ඔසවා නැගී
සිටීමට ශ්‍රී ලංකාවට
හැකිවී ඇත.

මානව සම්පත් පිළිබඳ ආයෝජනයේත්
ස්ත්‍රී පුරුෂ සමානත්ව ප්‍රවර්ධනයේත්
වැදගත්කම අවබෝධ කර ගත්
සංවර්ධනය වෙමින් පවත්නා මුල්ම
රටවල් අතුරෙන් ශ්‍රී ලංකාව එක් රටකි.
මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, ශ්‍රී ලංකාව
මානව සම්පත් සංවර්ධනයෙන් ලබා
ඇති ප්‍රතිඵල ඉහළ ආදායම් ලබන
රටවල් ලබා ඇති ප්‍රතිඵලවලට වඩාත්ම
අනුරූප වන්නේය."

ලෝක බැංකු වාර්තාව - 1999

# සවිමත් ආර්ථිකයක් කරා ....

- අපකීර්තිමත් ඉතිහාසයක් නිසා ජාත්‍යන්තර ප්‍රජාව අතර කෙළෙසුන ශ්‍රී ලංකා ප්‍රතිරූපය නැවත ගොඩ නගාගත හැකිවීම.
- 1994 වන විට බොහෝ දුරට ප්‍රතික්ෂේප වෙමින් තිබූ ලෝක බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ප්‍රධාන ආධාර කණ්ඩායම් වලින් ලද විදේශ ආධාර ප්‍රමාණය විශාල වශයෙන් වර්ධනය කරගැනීමට හැකිවිය.



- ආර්ථික වර්ධන වේගය 5%ක මට්ටමක තබා ගැනීම හා 1994 දී බිලියන 579ක් වූ දළ දේශීය නිෂ්පාදනය 1999 වන විට බිලියන 1111 දක්වා වැඩිකර ඇත.
- 1994 දී රුපියල් 25148ක් වූ ඒක පුද්ගල ආදායම 1999 දී රු. 58354 දක්වා වැඩි වී ඇත.
- 1994 දක්වා සීඝ්‍රයෙන් ඉහළ යමින් පැවති උද්ධමන වේගය 15% සිට 4.5% දක්වා අඩුකර ගැනීමට හැකි වී ඇත.
- පසුගිය වසර 6 තුළ විදේශ වත්කම් සංචිතය ඩොලර් මිලියන 1400 සිට 2500 දක්වා වර්ධනය කර ගැනීමට හැකි විය.

# සංවර්ධනයේ ප්‍රතිලාභ සැමට

- නව විදුලි උත්පාදන ව්‍යාපෘති මගින් මුළු ජනගහනයෙන් 2/3 කට විදුලිය බල පහසුකම් හිමිව ඇත. මෙය 58%ක වැඩිවීමකි.

- දුරකථන භාවිතාකරන්නන්ගේ සංඛ්‍යාව 1,80,000 සිට 850,000 දක්වා වැඩිවේ.



  - පෞද්ගලික වාහන හිමිකරුවන්ගේ සංඛ්‍යාව ලක්ෂ 3කින් වැඩිවීම.

  - පසුගිය වසර හය තුළ පොදු ප්‍රවාහණ පද්ධතියට බස් රථ 5550ක් ද දුම්රිය සඳහා බලවේග කට්ටල 6ක් ද, අළුත් දුම්රිය එන්ජින් 34ක් ද එක්කර ඇත:

  - දිවයින පුරා මාර්ග ක්ෂේත්‍රයේ සංවර්ධන කටයුතු සඳහා රුපියල් මිලියන 31,205ක් වැයකොට ඇත.

- පසුගිය වසර 6 තුළ නව නිවාස 2,39,767ක් හා ජන උදන ගම්මාන 500ක් ඉදිකළ අතර ජල හිගයෙන් පීඩා විඳි ලක්ෂ 40කට අධික පිරිසකට පානීය ජලය සපයා ඇත.

- පවුල් ලක්ෂ 19ක ජීවන තත්වය නංවාලීම සඳහා සමෘද්ධි සහනාධාර සඳහා පමණක් වසරකට රුපියල් මිලියන අට දහසක් රජය වැය කරයි.

# අභියෝග ජයගත හැකි පරපුරක් සඳහා....

- කොළඹ-කටුනායක, කොළඹ-මාතර, කොළඹ-මහනුවර සහ කොළඹට පිවිසෙන අධිවේගී මාර්ග ඉදිකිරීම සඳහා ඩොලර් මිලියන 1000ක් ඉදිරි හය වසර තුළ ආයෝජනය කරනු ඇත.
- රුපියල් මිලියන 800ක වියදමින් කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ නවීකරණය කරනු ඇත.



- වරාය සංවර්ධන කටයුතු සඳහා ඩොලර් මිලියන 1000ක් වැය කෙරේ.
- තම නිපුණතා වර්ධනය කරගනිමින් අනාගත අභියෝග ජයගත හැකි පරපුරක් බිහිකිරීමට අවශ්‍ය වන නව අධ්‍යාපන ක්‍රමයක් හඳුන්වා දී ඇති අතර රජය වසරකට අධ්‍යාපනය සඳහා පමණක් රුපියල් බිලියන 48500 වැය කරයි.

**ගෝලීයකරණයේ අභියෝග වලට අභීතව මුහුණ දිය හැකි සවිමත් දේශයක් සඳහා අවශ්‍ය සමාජීය හා ආර්ථික පසුබිමක් රජය දැනටමත් ස්ථාපිත කොට ඇත.**

මුදල් හා ක්‍රමසම්පාදන
අමාත්‍යාංශය

# ආර්ථික ස්ථාවරත්වය සමගින් ජනතාවට සහන රැසක්

- 1995 ට පෙර අවුරුදු පහ තුළ ආර්ථික වර්ධන වේගය සියයට 4.5ක් වුව ද ඉන් පසු කාලය තුළ සාමාන්‍ය ආර්ථික වර්ධන වේගය සියයට 5ක මට්ටමේ පැවතීම.
- 1994 දී දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 10ක් වූ අයවැය හිඟය වර්තමානය වන විට සියයට 7.5 දක්වා අඩුකර ගැනීමට හැකිවීම.



- 1996 දී සියයට 16ක් පමණ වූ උද්ධමන වේගය වසර 2000 මුල් භාගය වන විට සියයට 5 දක්වා පහත වැටීම.
- සියයට 24-27ක මට්ටමේ පැවති බැංකු පොලී අනුපාතිකය සියයට 14-17 දක්වා අඩු කිරීම.
- වසරක් පාසා ලක්ෂ 05ක් ශ්‍රම බලකායට එකතු වෙද්දීත්, විරැකියාව ලක්ෂ 08 සිට ලක්ෂ 06 දක්වා අඩු කිරීම. (මෙය විරැකියාවේ ප්‍රතිශතයක් ලෙස සියයට 14 සිට සියයට 08 දක්වා පහත බැසීමකි.)
- දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 17 මට්ටමේ පැවති ඉතිරි කිරීම් වසර 2000 වන විට සියයට 24 දක්වා ඉහළ නැංවීම.
- ආයෝජනය දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 25ක මට්ටමේ පවත්වා ගැනීමට සමත් වීම.

- 1994-2000 සමස්ත කාලය තුළ ම විදේශ වත්කම් සංචිතය ඇමෙරිකානු ඩොලර් මිලියන 2500 මට්ටමක පවත්වා ගැනීමට හැකිවීම. (1987-1990 කාලය තුළ විදේශ වත්කම් සංචිතය ඇමරිකානු ඩොලර් මිලියන 500ක්වූ අතර, 1990 සිට 1993 දක්වා සාමාන්‍ය විදේශ වත්කම් සංචිතය පැවතියේ ඇමෙරිකානු ඩොලර් මිලියන 1400ක මට්ටමකය.)

- 1994ට පසු ලක්ෂ 8ක් පමණ වූ රාජ්‍ය සේවකයන්ගේ වැටුප සියයට 50කින් වැඩි කිරීම.

| පහත දක්වෙන දර්ශකයන්ගෙන් පෙන්වන පරිදි ආර්ථික වර්ධනයේ ප්‍රතිලාභ සමස්ත සමාජය තුළ පුළුල් ලෙස බෙදී යාමට කටයුතු කිරීම. | 1993 / 1994 | 1999 / 2000 |
|---|---|---|
| ගෘහස්ත ගෑස් පරිභෝජනය (සිලින්ඩර්) | 190,000 | 14,000,000 |
| විදුලි බලය භාවිත කරන්නන්ගේ සංඛ්‍යාව | 1,651,844 | 2,849,229 |
| දුරකථන භාවිත කරන්නන්ගේ සංඛ්‍යාව | 180,724 | 850,000 |
| ත්‍රිරෝද රථ හිමියන්ගේ සංඛ්‍යාව | 22,605 | 89,000 |
| වෑන් රථ හිමියන්ගේ සංඛ්‍යාව | 64,216 | 125,761 |
| මෝටර් බයිසිකල් හිමියන්ගේ සංඛ්‍යාව | 662,450 | 777,217 |

- රජයේ සේවකයන්ට සපයනු ලබන ණය මුදල් සඳහා වූ පොලිය සියයට 7.2 සිට සියයට 4 දක්වා අඩු කිරීම.
- 1994 වසරේ දී මසකට රුපියල් 260කින් ද, ඉන් පසු වසර 5 තුළ සියයට 10කින් ද, 2000 වසරේ ජනවාරි මස සිට තවත් රු. 400කින් ද, තුන්ලක්ෂ පනස් දහසක් පමණ වන විශ්‍රාමිකයින්ගේ වැටුප් වැඩි කිරීම.
- මසකට රුපියල් 250 අඩු දීමනාවක් ලබන සමෘද්ධි ලාභීන්ගේ මාසික දීමනාව මසකට රුපියල් 150 කින්ද, මසකට රුපියල් 500ක් ලබන සමෘද්ධිලාභීන්ගේ දීමනාව රුපියල් 200කින්ද වැඩි කිරීම.

- රුපියල් 12,000/- කට වඩා අඩු වැටුපක් ලබන රජයේ සේවකයන්ට රුපියල් 600/- ක මාසික අතුරු දීමනාවක් ලබාදීම.

- මසකට රුපියල් 6000/- කට වඩා අඩු විශ්‍රාම වැටුපක් ලබන විශ්‍රාමිකයන්ට රුපියල් 300/- ක දීමනාවක් ලබාදීම.

- තිරිඟු පිටි කිලෝ ග්‍රෑම් 1ක් රුපියල් 3/- කින් මිළ පහත දැමීම.
- පොහොර සහනාධාර වැඩිකිරීම මගින් කිලෝ ග්‍රෑම් 50 පොහොර බෑගයක මිල රුපියල් 50කින් අඩුකිරීම.



- මසකට රුපියල් 5000ට වඩා අඩු මාසික ආදායමක් ලබන පවුල්වලට රුපියල් 100ක ගෑස් මිල සහනාධාරයක් ලබාදීම. (මෙම සමස්ත සහන වෙනුවෙන් රජය දරනු ලබන අතිරේක වාර්ෂික පිරිවැය රුපියල් මිලියන 5335කි.)

  ජනතා සුභසාධනය වෙනුවෙන් ක්‍රියාවට නගන ලද වැඩ සටහන් සඳහා වාර්ෂිකව දරනු ලබන වියදම.
- පවුල් ලක්ෂ 19 ක් හෙවත් මුළු පවුල් සංඛ්‍යාවෙන් සියයට 40 ක් සඳහා ලබාදෙන සමෘද්ධි සහනාධාරය වෙනුවෙන් රුපියල් මිලියන 8000කි.
- ලක්ෂ 40ක් වන පාසල් යන සියළුම ළමුන් සඳහා පාසල් නිල ඇඳුම් හා පෙළ පොත් නොමිලේ ලබාදීම සඳහා රුපියල් මිලියන 1600කි.
- සරණාගතයන් බවට පත්ව ඇති පුද්ගලයන් වෙනුවෙන් රුපියල් මිලියන 3040ක්. පොහොර සහනාධාර වෙනුවෙන් රුපියල් මිලියන 1500කි.
- ඩීසල්, භූමිතෙල්, විදුලිය, ජලසම්පාදනය, දුම්රිය සේවය හා බස් ප්‍රවාහණ සඳහා ලබාදෙන මිල සහනාධාරය වෙනුවෙන් රුපියල් මිලියන 12950කි.

**සංවර්ධන කටයුතු සඳහා වෙන් කරනු ලබන ප්‍රාග්ධන වියදම් සමඟ සහනාධාර වෙනුවෙන් ද මුදල් වෙන් කිරීම සුවිශේෂයි.**

බුද්ධ ශාසන
අමාත්‍යාංශය

# වෙසක් පෝය ජාත්‍යන්තරව සැමරේ

- රජයේ ඉල්ලීම මත ඉතිහාසයේ ප්‍රථම වරට වෙසක් පෝය දිනය ජාත්‍යන්තර වශයෙන් සැමරිය යුතු දිනයක් ලෙස එක්සත් ජාතීන්ගේ සංවිධානය ප්‍රකාශයට පත් කරයි.
- ත්‍රස්තවාදීන් විනාශ කළ අතිපූජනීය ශ්‍රී දළදා මාලිගය ජනාධිපති අරමුදලින් රුපියල් මිලියන 125ක් වැය කර ප්‍රතිසංස්කරණ කරන ලදී.



- දහම් පාසල් සංවර්ධනයට වැය කළ මුදල 1994 දී රුපියල් මිලියන 19.2ක් වූ අතර එය 2000 දී රු. මිලියන 52.6 දක්වා වැඩි කරනු ලැබීය. මීට අමතර ව ගරු ජනාධිපතිනිය විසින් දහම් පාසල් 7000ක් සඳහා රුපියල් ලක්ෂ 700ක් ලබා දී ඇත.
- විහාරස්ථාන 247ක් සඳහා රුපියල් ලක්ෂ 26ක මූල්‍ය ආධාර සපයා ඇත.
- නේපාල, ලුම්බිණි, ශ්‍රී ලංකා විහාරය හා නවදිල්ලි විශ්‍රාම ශාලාව ගොඩනැගීම සඳහා රුපියල් මිලියන 52ක් ආධාර සපයා ඇත.
- 1994 සිට සාමණේර හිමිවරුන් 2300ක් සඳහා ලබා දෙන ලද මූල්‍යාධාර ප්‍රමාණය රුපියල් 41,40,000කි.
- සාමණේර ආශ්‍රම 30ක් සඳහා වාර්ෂිකව රුපියල් 19,20,000ක් වැය කෙරේ.

- සාර්ක් කලාපීය රටවලින් බුදුදහම හැදෑරීම සඳහා පැමිණෙන භික්ෂූන් වහන්සේලා සඳහා ශිෂ්‍යත්ව පිරිනැමීමේ ක්‍රමයක් ආරම්භ කරන ලදි.

- දේශීය මෙන්ම ජාත්‍යන්තර වශයෙන් බෞද්ධ තොරතුරු සම්පාදනයට රුපියල් මිලියන 10ක වියදමින් බෞද්ධ තොරතුරු මධ්‍යස්ථානයක් ඉදි කෙරේ.



- 1994-99 තුළ දී බුද්ධ ශාසන අරමුදල මගින් සාමණේර හිමිවරුන් 2300ක් සඳහා අධ්‍යාපන හා ප්‍රත්‍ය පහසුකම් සැපයීම සඳහා වාර්ෂිකව රුපියල් 41 ලක්ෂයක් වැය කරයි.

- සාමණේර ආයතන 30ක් ලියාපදිංචි කර එම ආයතන පවත්වා ගෙන යෑම සඳහා වාර්ෂිකව රුපියල් 19 ලක්ෂයකට අධික මූල්‍ය ආධාර සැපයේ.

- දහම් පාසැල් පොත් මුද්‍රණය සඳහා 1994 වෙන් කළ රුපියල් ලක්ෂ 135ක මුදල 2000 වසර වන විට හාර ලක්ෂ පනස් දහස දක්වා වැඩි කරනු ලැබීය.

**බුද්ධ ශාසනය ආරක්ෂා කිරීම හා පෝෂණය කිරීම සඳහා රජයේ දායකත්වය වැඩිවේ.**

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

# ප්‍රථම වරට රාජ්‍ය සේවකයින්ට රජයෙන් රක්ෂණයක්

- ලක්ෂ පහකට ආසන්න රජයේ සේවකයින්ට නොමිලේ "අග්‍රහාර" වෛද්‍ය රක්ෂණ ක්‍රමය ඇති කිරීම, රාජ්‍ය සේවක ශුභ සාධනයේ ඓතිහාසික මෙහෙවරකි.
- පරිපාලන සේවය, කණිෂ්ඨ සේවක, ග්‍රාම සේවා, විවාහ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර්වරු ඇතුළු නව පත්වීම් 6808ක් අලුතින් ඇති කෙරේ.



- පසුගිය හය වසර තුළ දී සේවක වැටුප 60%කින් වැඩි වේ.
- විශ්‍රාමික වැටුප දෙවතාවක දී රු 100කින් හා 300කින් වැඩි කෙරේ.
- රාජ්‍ය සේවක ණය සඳහා වූ පොළිය සියයට 7.2 සිට සියයට 4 දක්වා අඩු කෙරේ.
- රජයේ සේවක වැටුප් තව දුරටත් වැඩිකිරීමට වැටුප් කොමිසමක් පත් කෙරේ.
- විශ්‍රාමික වැටුප් විෂමතා අහෝසි කර නව වැටුප් ක්‍රමයක් සකස් කිරීමට කටයුතු කෙරේ.

- රාජ්‍ය පරිපාලනය වඩාත් විමධ්‍යගත කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල සංඛ්‍යාව වැඩි කෙරේ.
- දැඩි දුෂ්කරතාවන්ට මුහුණ පාමින් සිටි දෙලක්‍ෂ තිස් නව දහක් පමණ වූ කුඩා තේවතු හිමියන්ට ලබා දුන් සහන හරහා සමස්ත තේ නිෂ්පාදනය 16%කින් වැඩි වේ.




- අලුතින් තේ කර්මාන්ත ශාලා 75ක් විවෘත කරන ලදී.
- පොහොර මෙට්‍රික් ටොන් 52, 913 ක් කුඩා තේ වතුහිමියන්ගේ සමිති මගින් බෙදා හරින ලදී.
- තේ කර්මාන්තයේ ප්‍රවර්ධනය සඳහා යන්ත්‍ර සූත්‍ර හා පොහොර මිල දී ගැනීමට රුපියල් මිලියන 784ක් ලබා දී ඇත.
- 'තේ ශක්ති' වැඩ සටහන සඳහා සමාජිකයන් 100, 924, දයක වෙමින් ඉතුරුම් ආයෝජන සඳහා යොදවන ලද මුදල රු. මිලියන 79.8ක් විය.
- තේ ශක්ති රක්‍ෂණ ප්‍රතිලාභ ලෙස රු. මිලියන 11.4ක් 'තේ ශක්ති' පවුල් අතර බෙදා දී ඇත.



5-

- 35,000ක් පමණ වන වතු කාර්ය මණ්ඩලය සඳහා වැවිලි ප්‍රතිව්‍යුහකරණ ව්‍යාපෘතිය යටතේ විධිමත් පුහුණුවක් ලබා දී ඇත.

- ස්වශක්ති නිවාස ආධාර පවුල් 13,484, කට ලබා දී ඇත.




- පිරිසිදු පානීය ජල පහසුකම් ලබා දෙන ලද පවුල් සංඛ්‍යාව 8,50,662කි.

- රුපියල් මිලියන 100ක් සහනාධාර වශයෙන් ලබා දෙමින් පොල් වගාවන්හි අතුරු බෝග වැවීම දිරිමත් කර ඇත.

- කප්රුක ආයෝජන යෝජනා ක්‍රමය යටතේ රුපියල් මිලියන 49.62 ක ණය ප්‍රමාණයක් ද වගා සංවර්ධනය වෙනුවෙන් ලබා දී ඇත.

- පහත වැටී තිබූ රබර් කර්මාන්තය නංවාලමින් 1999 වන විට නිෂ්පාදන ප්‍රමාණය මෙට්‍රික් ටොන් 96,504 දක්වා වැඩි දියුණු ලදී.


- දිසිදි පොල් කර්මාන්තශාලා හා කොහු කර්මාන්තශාලා නවීකරණය කිරීමට රුපියල් මිලියන 28.5ක් ලබා දී ඇත.

**රාජ්‍ය සේවයේ ස්වාධීනත්වයත්, වැවිලි ක්ෂේත්‍රයේ පුනර්ජීවයත් තුළින් ශක්තිමත් ආර්ථිකයකට අත්වැලක්.**

අධිකරණ හා ව්‍යවස්ථා කටයුතු
අමාත්‍යාංශය

# වාර්ගික අර්බුදයට තිරසාර විසඳුමක්

- පීඩාකාරී යුද්ධය නිමාකරමින් ජනවාර්ගික අර්බුදයට විසඳුමක් වශයෙන් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සැකසේ.
- සමාජ ශුභ සිද්ධිය සඳහා ක්‍රියාකිරීමට අධිකාරී බලතල සහිත නව පනත් ස්ථාපනය විය.



- ප්‍රථම වරට ළමා පරපුර ආරක්‍ෂා කිරීම සඳහා ජාතික ළමා ආරක්‍ෂක අධිකාරියක් පිහිටුවීම.
- කාන්තා අයිතිවාසිකම් සුරැකීම සඳහා දණ්ඩ නීති සංග්‍රහයේ සංශෝධන ඇතුලත් නව නීති සම්පාදනය කෙරේ.
- බන්ධනාගාර තදබදය අඩුකිරීම හා සමාජය වෙත වැඩදායි පුරවැසියන් බිහිකිරීමේ අරමුණින් ප්‍රජා සේවා විශෝධන මධ්‍යස්ථාන අරඹා ඇත.
- 1997 දී පිහිට වූ 'සහන් පියස' කාර්යාලයෙන් යුද්ධය නිසා අවතැන් වූ ජන කොටස් වලට නොමිලේ නීතිමය ආධාර ලබා දීමට කටයුතු යොදා ඇත.
- ජනවාර්ගික ඒකාබද්ධතාවයන් ප්‍රවර්ධනයට සඳහා වන ව්‍යාපෘති වෙනුවෙන් රුපියල් ලක්‍ෂ 25ක් වැය කෙරේ.

- සමථ මණ්ඩල ක්‍රියාකාරීත්වය රට පුරා ව්‍යාප්ත කිරීමට 2000 වර්ෂය වන විට රුපියල් මිලියන 18ක් වැය කර ඇත.
- අඩු ආදායම් ලාභීන්ට සහනයක් ලබාදීමේ අරමුණින් ප්‍රජා නීති සේවා මධ්‍යස්ථාන දිවයින පුරා පිහිටුවා ඇති අතර ඒ සඳහා අමරිකානු ආධාරද සහිතව රුපියල් ලක්ෂ 91ක් වියදම් කර ඇත.



- ලෝක බැංකු ආධාර යටතේ ව්‍යාපාරික ප්‍රජාවට හා මහජනතාවට තොරතුරු ලබාදීම සඳහා නෛතික තොරතුරු පද්ධතියක් ආරම්භ කෙරේ.
- දිවයිනේ විවිධ ස්ථානවල පිහිටි පූජනීය සිද්ධස්ථාන වැඩි දියුණු කිරීම සඳහා මහා භාරකාර අරමුදලින් රුපියල් ලක්ෂ 25ක් වැය කර ඇත.
- අධිකරණ ශාලා ප්‍රතිසංස්කරණය සඳහා රුපියල් මිලියන 19 වැය කෙරේ.

**ජනවාර්ගික අර්බුදයට නෛතික විසඳුම් සමගින්**
**ළමා සහ කාන්තා අයිතිවාසිකම් සුරැකීමට**
**පියවර ගැනීම තුළින් ජනතා පරමාධිපත්‍ය**
**පෙරටත් වඩා තහවුරු කෙරේ.**

# ගැමි ජනතාවගෙන් 55%කට විදුලිය

- 1999 අවසාන වනවිට මෙරට නිවාස සංඛ්‍යාවෙන් 56.6%කට විදුලිය සපයා ඇත. 2005 වනවිට මෙය 80% දක්වා වර්ධනය කිරීමට සැළසුම් කර ඇත.



- රුපියල් මිලියන 15,000ක වියදමින් කුකුලේ ගඟ ජල විදුලි යෝජනා ක්‍රමය ඇරඹේ. මෙමගින් වාර්ෂිකව විදුලි ඒකක මිලියන 317ක් උත්පාදනය කෙරේ.
- රුපියල් මිලියන 13,500ක වියදමින් කැලණිතිස්ස හා සපුගස්කන්ද විදුලි පරිශ්‍රයන් තුළ නව ඩීසල් බලාගාර 3ක් ඉදිකිරීම තුළින් මෙ. වො. 155ක විදුලි ධාරිතාවයක් අළුතින් උත්පාදනය කෙරේ.
- පෞද්ගලික අංශයේ ආයෝජන ද සහිතව ඇරඹූ නව තාප විදුලි බල ව්‍යාපෘති මගින් ස්ථාපිත විදුලි බල ශක්තිය මෙ. වො. 588 දක්වා වැඩි කර ගැනීමට හැකි වී ඇත. මෙය 1994ට වඩා දෙගුණයක වැඩිවීමකි.

- විදුලිය සැපයීම සඳහා 1994 වැය කළ මුදල රුපියල් මිලියන 3700කි. එය 1999 වන විට රුපියල් මිලියන 15285 දක්වා වැඩිකර රටේ ජනගහනයෙන් 2/3කට විදුලිබලය සපයා ඇත.

- [illegible]
- [illegible]



- [illegible] 1950 [illegible] 675 [illegible]
- [illegible] 780 [illegible]
- [illegible]

**ග්‍රාමීය ප්‍රදේශවල විදුලිය සැපයුම වේගවත් වීම හා දැඩි නියඟයකට මුහු[illegible]**
**විරෝධතා දෙන පරිදි ජාතික විදුලිබල පද්ධතිය වැඩිදියුණු කිරීම**
**පසුබිම 6 වසරෙහි හැකි පෙනේ.**


# ශ්‍රී ලංකාවේ සිව් වැනි ආදායම් මාර්ගය


- විදේශ විනිමය රුපියල් මිලියන 18,265ක් දක්වා වැඩි වෙයි. මෙය 1994ට වඩා 62%ක වැඩි වීමකි.
- සංචාරක කර්මාන්තයේ පමණක් සෘජු හා වක්‍ර රැකියා අවස්ථා 87,000ක් උත්පාදනය වෙයි. මෙය 94ට වඩා 7.12%ක වර්ධනයකි.



- හෝටල් කාමර ප්‍රමාණය 13605 දක්වා වැඩිවේ. මෙය පස් වසරකට පෙර තිබූ කාමර සංඛ්‍යාවට වඩා කාමර 3240 ක වැඩි වීමකි.
- රුපියල් මිලියන 265ක වියදමින් තැනෙන ආසියානු කලාපයේ නවීනතම හෝටල් පාසල පාඨමාලා අරඹයි.
- රුපියල් මිලියන 21ක වියදමින් අනුරාධපුර සංචාරක තොරතුරු මධ්‍යස්ථානය නිමවේ.
- ගුවන් තොටුපළ සංවර්ධනයට රුපියල් මිලියන 8000 ආයෝජනයක්.
- එයාර් ලංකා සමාගමේ 20 වසරක ඉතිහාසය තුළ ප්‍රථම වරට රුපියල් මිලියන 702ක් ලාභාංශ ලෙස භාණ්ඩාගාරයට ලැබේ.

- නව ගුවන් යානා 6ක් සමඟ ජාතික ගුවන් සේවයේ ගුවන් යානා ප්‍රමාණය 12 ඉක්මවයි.
- ජාතික සත්වෝද්‍යානයේ රුපියල් මිලියන 215 වාර්තාගත ආදායමක්.




- රුපියල් මිලියන 1000ක වියදමින් දෙවන, ජාතික සත්වෝද්‍යානය පින්නවල ඉදිවේ.
- රුපියල් මිලියන 77ක වියදමින් පැරණි ලන්දේසි රෝහල සංචාරක මධ්‍යස්ථානයක් සේ ප්‍රතිසංස්කරණ කෙරේ.
- හෝටල් ප්‍රතිසංස්කරණ හා වැඩිදියුණු කිරීමට අදාළ උපකරණ තීරු බදුවලින් නිදහස් කෙරේ.
- සංචාරක කර්මාන්තයේ හෝටල් සහ ප්‍රධාන නියෝජිත ආයතනයන් සඳහා තීරු බදු රහිත වාහන

**යුද්ධයක් පවතිත්දිත් සංචාරක කර්මාන්තය උපයන ආදායම අද ශ්‍රී ලංකාවේ සිව්වන ආදායම් මාර්ගය බවට පත් වී ඇත. මෙය රජයේ සැළසුම් සහගත ක්‍රියාදමයන්ට හොඳම සාක්ෂියකි**

# අපනයනය වැඩිවේ. අවාසිදායක වෙළෙඳ පරතරය අඩුවේ.

- 1999 මැයි මස වන විට "සයිබර් ට්‍රේඩර්" සේවාව විවෘත කිරීමෙන් විදේශ වෙළෙඳ පොළට ප්‍රවිෂ්ට වීම සඳහා දේශීය නිෂ්පාදකයින්ට අවස්ථාව සලසන ලදී.
- සතොස වෙළෙඳ සැල් නවීකරණය කර දීපව්‍යාප්ත සතොස නියෝජිත වෙළෙඳ මධ්‍යස්ථාන ජාලයක් පිහිටුවනු ලැබීය.



- 1994 දී ඇ. ඩො. මිලියන 3214ක් වූ සමස්ත අපනයන ආදයම 1999 දී ඇ. ඩො. මිලියන 4721 දක්වා වර්ධනය කරන ලදී.
- 1994න් පසුව අත්සන් තැබූ නව වෙළෙඳ සහයෝගිතා ගිවිසුම මගින් ශ්‍රී ලංකාවට අවාසිවන වෙළෙඳ පරතරය අඩු කරගැනීමට හැකිවිය.
- සප්තා හෙවත් දකුණු ආසියානු වරණීය වෙළෙඳ ගිවිසුම 1995 දී ක්‍රියාත්මක කිරීම තුළින් භාණ්ඩ 2097කට එතෙක් ක්‍රියාත්මක වූ බදු සහ බදු නොවන බාධක ඉවත් විය.
- සප්තා ගිවිසුම යටතේ 1998 දේශීය නිෂ්පාදන අපනයනය තුළින් ඇමරිකානු ඩොලර් මිලියන 16.16ක ආදායමක් 1998 වනවිට උපයා ගත හැකි වී ඇත.
- 1994 වසරෙන් පසුව විදේශ රටවල් බොහොමයක් සමග වෙළෙඳ සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීමට හැකි විය.

- ශ්‍රී ලංකාවට අවාසිදායක වූ ද්විපාර්ශ්වික වෙළෙඳ පරතරය අඩු කිරීමට
වූ අතර 1994 දී ඇ. ඩො. මිලියන 3214 වූ සමස්ත අපනයන [illegible] 19
දී ඇ.ඩො. මිලියන 4721ක් දක්වා වැඩි විය.

- දේශීය නව නිපැයුම් කරුවන් දිරිගැන්වීම සඳහා ජනාධිපති සම්මාන ක්‍රම
හඳුන්වාදී ඇත.



- පාසල් පද්ධති තුළින් තරුණ නව නිපැයුම්කරුවන්ගේ සමිති
2250ක් දනවමින් ශ්‍රී ලංකාව පුරා පිහිටුවා ඇත.

- ගතවූ හය වසර තුළ මහ පොළ ප්‍රදර්ශන මගින් රුපියල් මිලියන
5ක් පාසල්වල සංවර්ධනය සඳහා බෙදා දී ඇත.

- 1999 වසරේදී ලබාදුන් මහපොළ ශිෂ්‍යත්ව ප්‍රමාණය 5700කි.

- 1994 වසර වන විට රු. 1000/= වූ මහපොළ ශිෂ්‍යත්ව ආධාර මුදල රු. 1500/-
දක්වා වැඩිකර ඇත.

- කෘෂිකාර්මික නිපැයුම් අලෙවි සංවර්ධනය සඳහා රුපියල් මිලියන 200ක
ප්‍රදානයන් ලබා දී ඇත.


**නව වෙළෙඳ සහයෝගිතා ගිවිසුම් තුළින්**
**දේශීය නිෂ්පාදකයින්ට වාසිදායක**
**විදේශීය වෙළෙඳ පොළක්**

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

කෘෂිකර්ම හා ඉඩම්
අමාත්‍යාංශය

# පසුගිය දශකයේ වැඩිම වී අස්වැන්න

- දේශීය සහල් අවශ්‍යතාවයෙන් සියයට 96ක් මෙරට ගොවි බිම් වලින් නිෂ්පාදනය කිරීමට පසුගිය වසර හය තුළ හැකිවිය.
- 1996 දී ටොන් 341201ක් වූ සහල් ආනයනය 1998 වන විට 167567 දක්වා අඩු කිරීමෙන් විදේශ විනිමය රුපියල් මිලියන 2499ක් ඉතිරි කරගත හැකිවිය.



- අපනයන බෝග මගින් 1994 දී ඉපැයූ රුපියල් බිලියන 265ක් වූ විදේශ විනිමය 1998 දී රුපියල් බිලියන 600 දක්වා වැඩි වී ඇත.
- අපනයන බෝග වගාබිම් ප්‍රමාණය හෙක්ටයාර් 10,000කින් ඉහළ ගොස් ඇති අතර අපනයනය කළ කෘෂි භෝග ප්‍රමාණය මෙට්‍රික් ටොන් 5100කින් වැඩි වී ඇත.
- ස්වයං රැකියාවක් ලෙස මල් වගාව වැඩි දියුණු කිරීමට 15000කට පමණ තාක්ෂණික උපදෙස් ලබා දී ඇති අතර මල් අපනයනය මගින් රුපියල් මිලියන 490 විදේශ විනිමයක් උපයා ගැනීමට හැකිවිය.
- බාහුවාර්ශික බෝග සංවර්ධනය යටතේ නිෂ්පාදකයින් 5171කට රුපියල් මිලියන 570ක ණය සහ රුපියල් මිලියන 48ක සහානාධාර සපයා ඇත.

- වගා ආධාර යටතේ සංවර්ධනය කළ බිම් ප්‍රමාණය හෙක්ටයාර් 8664කි. මෙමගින් ප්‍රතිලාභ ලැබූ පුද්ගලයින්ගේ සංඛ්‍යාව 5751කි.

- 1989 දී එවකට පැවති රජය මුළුමනින්ම අහෝසි කළ පොහොර සහනාධාරය 1994 සිට යළි ගොවීන්ට ප්‍රදානය කෙරිණ. මේ සඳහා 1998 වසරේ පමණක් රජය රුපියල් මිලියන 2215ක් වැය කර ඇත.



- වාරි ජල ප්‍රශ්නයට විසඳුමක් වශයෙන් කෘෂි ළිං ඉදිකිරීම සඳහා රුපියල් මිලියන 113ක් වැය කරමින් කෘෂි ළිං 5284 ඉදිකර ඇත.


- ගොවි සංවිධාන 1026ක් යටතේ වාරි කර්මාන්ත 2606ක් නිමකර ඇත. මේ සඳහා රජය වැයකර ඇති මුදල රුපියල් මිලියන 51කි.

- නේවාසික ගොවි මධ්‍යස්ථාන 3ක් ඇතුළුව පුහුණු මධ්‍යස්ථාන 20ක් ඉදිකිරීමට රුපියල් මිලියන 38ක් වැය කර ඇත.

- 1996 සිට 1999 දක්වා සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණය සඳහා රජය වැයකර ඇති මුදල රුපියල් මිලියන 787ක් වන අතර මේ යටතේ අලුත්වැඩියා කර ඇති සුළු වාරිමාර්ග සංඛ්‍යාව 1426කි.

- 1999 වන විට වාරි කර්මාන්ත 875ක් සලාක ආහාර වැඩපිළිවෙල යටතේ පුනරුත්ථාපනය කළ අතර, ඒ සඳහා ගොවීන්ට නිකුත් කළ ආහාර ද්‍රව්‍ය වෙනුවෙන් හා නිර්මිත ඉදිකිරීම් සඳහා රුපියල් මිලියන 32ක් වැය කර ඇත.

- ගොවීන්ගේ වගා කටයුතු කාර්යක්ෂම කිරීම සඳහා සහන මිල යටතේ කෘෂි යන්ත්‍රෝපකරණ සැපයීමට රජය දරූ වියදම රු. මිලියන 430කි.
- පසුගිය පස් වසර තුළ ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමයට 460000ක් දයක වූ අතර එ මගින් රුපියල් මිලියන 47ක් රක්ෂණ වන්දි වශයෙන් ගෙවා ඇත.




- ගොවීන්ගේ ශක්තිය වර්ධනය කරමින් ගොවි කේන්ද්‍ර පදනම් කරගෙන ගොවි සංවිධාන 14200 පිහිටුවා ඇති අතර එහි අරමුදල රුපියල් මිලියන 99 ඉක්මවා ඇත.
- විවෘත ආර්ථිකයේ අභියෝග වලට මුහුණ දීම සඳහා යැපුම් මට්ටමේ සිටින සුළු ගොවීන් වානිජ මට්ටමට ගෙන ඒමට ගොවි සමාගම් 85ක් ස්ථාපිත කරන ලදී.
- ගොවි ජන බැංකු ණය යෝජනා ක්‍රමය යටතේ ගොවීන් 8500ක් සඳහා පසුගිය වගාකන්න දෙක තුළ දී ණය වශයෙන් ලබාදුන් මුදල රුපියල් මිලියන 55කි.
- ජයභූමි ඔප්පු 91,8847ක් ඉඩම් නැති අයට ප්‍රදානය කර ඇත.
- ලෝක ආහාර වැඩ පිළිවෙළ යටතේ වූ ගොවි සංවිධාන 740ක් වැව් නඩත්තු කිරීමට ඉතිරිකර ඇති මුදල 8617682කි. ලෝක ආහාර වැඩ සටහන යටතේ 1994 සිට 1999 දක්වා ඇල මාර්ග කිලෝ මීටර් 400ක් නිමකර ඇති අතර ඊට වැයකළ මුළු වියදම රුපියල් මිලියන 45කි.


**පොහොර සහනාධාරය යළි ලබාදීම හා ගොවි ණය කපා හැරීම පසුගිය සමයේ ඉටුකළ කාර්ය අතර කැපී පෙනේ.**



8-

# මත්ස්‍ය නිෂ්පාදනය වැඩිවේ. සාගර විශ්ව විද්‍යාලය බිහිවේ

- 1994 දි මෙ. ටො. 212,000ක් වූ කරදිය මත්ස්‍ය නිෂ්පාදනය 1999 දි මෙ. ටො. 248,450 දක්වා වැඩි වී ඇත.
- 1994 දි මෙ. ටො. 12,000ක් වූ මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය 1999 දි මෙ. ටො. 31,450 දක්වා වැඩිවී ඇත. මෙය මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනයේ 150%ක වර්ධනයකි.



- මත්ස්‍ය නිෂ්පාදන අපනයනය 1994 දි මෙ. ටො. 7194ක් වූ අතර 1999 වනවිට මෙ. ටො. 9793ක් දක්වා ඉහළ නැංවීමට හැකි වී ඇත.
- ධීවරයින්ට නව පාරිතෝෂික ක්‍රමයක් හඳුන්වා දි පසුගිය හය වසර තුළ නව ධීවර යාත්‍රා 511ක් ද, එන්ජින් 151ක් ද, ධීවර ඔරු 116ක් ද ලබා දි ඇත.
- ප්‍රථම වරට වෙරළ ආරක්ෂක බලකායක් පිහිට වූ අතර එමගින් අනවසර විදේශීය ධීවරයන්ගෙන් රුපියල් මිලියන 10කට අධික දඩ මුදලක් ලබාගැනීමට හැකිවිය.
- බහු දින ධීවර යාත්‍රා සඳහා ප්‍රථම වරට නවීන සන්නිවේදන ජාලයක් ලබා දී ඇත.

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

- ධීවර පවුල් සඳහා දියවර නිවාස 6200ක් මේ වනවිට රුපියල් මිලියන 310 වියදමින් ඉදිකර ඇත.

- ධීවර පවුල් 12,000ක් සඳහා ධීවර ගම්මාන 150ක පහසුකම් සහිත [illegible] ධීවර නිවාස ඉදිකර ඇත. මේ සඳහා වැයකළ මුදල රුපියල් මිලියන 281කි.



- ධීවර ප්‍රජාව උදෙසා පානීය ජල යෝජනා ක්‍රම 79ක් හා විදුලි යෝජනා ක්‍රම 279ක් පසුගිය වසර හය තුළ ක්‍රියාවට නගා ඇත. මේ සඳහා වැය කළ මුදල රුපියල් මිලියන 569කි.

- ධීවර ගම්මාන 54කට ළදරු උයන් හා ළදරු පාසැල් උපකරණ ලබා දී ඇත.

- ධීවර ගම්මාන තුළ ඇති කරන ලද නව මාර්ගවල ගණන 205කි. ප්‍රජා ශාලා ගණන 35කි.

- ධීවර ජනතාව වෙනුවෙන් 'දිවිවර' නමින් රුපියල් මිලියන 10ක වියදමින් බැංකු ශාඛා පිහිටුවා ඇති අතර 2000 වසර සඳහා තවත් බැංකු 4ක් ඉදිකිරීමට යෝජිතයි.

- [illegible]

- කුඩාවැල්ල, හික්කඩුව හා මොරටුව ධීවර වරායවල් දැනටමත් ඉදිකර ඇති අතර කිරින්ද, තංගල්ල, දෙවුන්දර, මිරිස්ස, බේරුවල ධීවර වරායවල් නවීකරණය විය.



- ධීවර කර්මාන්තයේ නිපුණතාවන්ට නව තාක්ෂණික ක්‍රම පුහුණු කිරීම සඳහා ජාතික ධීවර ඉන්ජිනේරු ආයතනය හා සාගර විශ්ව විද්‍යාලය ආරම්භ කිරීම.
- ධීවර සංස්ථාව හා සිනෝර් ආයතනය නැවත ප්‍රතිසංස්කරණය කර ධීවර ආම්පන්න සැපයීම සහ නවීකරණය කරන ලද මත්ස්‍ය බෙදාහැරීමේ ක්‍රම විධිමත් කර ඇත.
- ශ්‍රී ලංකා ජලජීවී වගා අධිකාරිය නමින් නව ආයතනයක් ඇතිකර එමඟින් මත්ස්‍ය බීජ නිෂ්පාදනය හා ඉස්සන්, කකුළුවන් වගාවට නව තාක්ෂණය හඳුන්වාදීමට පියවර ගෙන ඇත.
- ධීවර කර්මාන්තයට අදාළ නාවික සිතියම් ඇතුළු දත්ත රැස්කිරීම සහ මත්ස්‍ය ජාන බැංකුවක් පිහිටුවීමට කටයුතු කෙරේ.

**කරදිය හා මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය වැඩිවීම, දියවර ගම්මාන සංකල්පය යටතේ නව ගම්මාන ඉදිවීම, ධීවර නිවාස වැඩි දියුණු වීම හා ධීවර විශ්ව විද්‍යාලයක් ඇරඹීම. පසුගිය 6 වසර තුළ ධීවර ක්ෂේත්‍රයේ සිදුවූ සුවිශේෂ කාර්යයන් අතර වේ.**

අධ්‍යාපන හා උසස් අධ්‍යාපන
අමාත්‍යාංශය

# සෑම ප්‍රදේශයකටම ජාතික පාසලක්

- ඉතිහාසයේ ප්‍රථම වතාවට ලක්ෂ 2ක් වූ ගුරුවරුන් සඳහා ගුරු සේවාවක් ස්ථාපිත වේ.
- ගුරු වැටුප් 75% කින් වැඩිකරන ලදී. මේ සඳහා රජය වසරකට වැයකරන අතිරේක මුදල රුපියල් මිලියන 6077කි.




- ජාතික ගුරු අධ්‍යාපන ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීම හා විදුහල්පති සේවාවක් පිහිටු වීම.
- නව අධ්‍යාපන පීඨ 5ක් බිංගිරිය, අක්මීමන, කහවත්ත හා යාපනය යන ස්ථානයන්හි පිහිටුවා ඇත. මේ සඳහා රජය වැය කළ වියදම් රුපියල් මිලියන 1158කි.
- මහවැලි, පස්දුන්රට, සියනෑ, නිල්වලා, වවුනියා සහ අඩලච්චේනි විද්‍යා පීඨ රුපියල් මිලියන 395කින් නවීකරණය විය.
- අඛණ්ඩ ගුරු අධ්‍යාපන හා අධ්‍යාපනික සංවර්ධන වැඩ සඳහා රුපියල් මිලියන 35ක් වැයකර ගුරු මධ්‍යස්ථාන 84ක් දිවයින පුරා ඉදිකරනු ලැබීය.
- ප්‍රථම වතාවට විදුහල්පති වරුන්ට හා ගුරුවරුන්ට විදේශයන්හි දී කළමනාකරණ පුහුණුවක් ලබාදීමට අවස්ථා උදාකර දෙන ලදී.



9-

- ජාතික ගුරු මාරු ප්‍රතිපත්තියක් හඳුන්වා දී ඇත.
- එක්සත් රාජධානි ආධාර යටතේ ප්‍රාථමික පංති තුළ ඉංග්‍රීසි භාෂාව විධිමත්ව ඉගැන්වීමේ වැඩ සටහනක් ක්‍රියාවට නැගේ. සේ සඳහා වැය කෙරෙන මුදල රුපියල් මිලියන 120කි.




- රුපියල් මිලියන 1455ක ජපන් ආධාර හා රුපියල් මිලියන 100ක දේශීය ප්‍රතිපාදන සහිතව කණිෂ්ඨ පාසල් 25ක් සංවර්ධනය කර ඇත.
- එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකට 2ක් බැගින් වන සේ තෝරා ගත් පාසල් විද්‍යාගාර, පුස්තකාල හා පරිගණක පහසුකම් සහිතව අංග සම්පූර්ණ පාසල් බවට පත්කිරීමට රුපියල් මිලියන 333ක් වියදම් කර ඇත.
- අ.පො.ස සාමාන්‍ය පෙළ හා උසස් පෙළ සිසු අධ්‍යාපනය වෙනුවෙන් පරිගණක මධ්‍යස්ථාන 72ක් ද, වැඩි දියුණු කරන ලද උපාංග සහිත පරිගණක පාසල් 1796ක් අතර බෙදා දීමට 1999 වසරේ දී දරන ලද වියදම. රුපියල් මිලියන 100කි.
- ලෝක බැංකු ආධාර යටතේ රුපියල් මිලියන 450ක වියදමින් සෑම පළාතකම පාසල් 50 බැගින් තෝරා පරිගණක ලබාදීම අරඹා ඇත.
- පාසල් පුස්තකාල 2000ක් අලුතින් ඉදිකිරීමට හා තවත් පුස්තකාල 2000ක් නවීකරණ කිරීමට රජය රුපියල් මිලියන 961ක් වැය කර ඇත.

- වර්ණයෙන් මුද්‍රිත පාසල් පොත් නොමිලේ සැපයීම සඳහා රජය වසරකට රුපියල් මිලියන 600ක් වැය කරයි.

- පාසල් නිල ඇඳුම් නොමිලේ සැපයීම සඳහා රජය වාර්ෂිකව දරන වියදම රුපියල් මිලියන 995කි.



- අග්නිදිග, රජරට, සබරගමුව හා වයඹ යන විශ්වවිද්‍යාල 5ක් අලුතින් විශ්වවිද්‍යාල පද්ධතියට එක් වෙයි.

- විශ්ව විද්‍යාලවලට ඇතුළත් කරගන්නා සංඛ්‍යාව 9460 සිට 11,747 දක්වා වැඩි කර ඇත. මෙම ප්‍රමාණය 2002 වන විට 15,900 දක්වා වැඩි කිරීමට අපේක්ෂිතය.

- විශ්ව විද්‍යාල සිසුන් සඳහා නේවාසික පහසුකම් සංවර්ධනය වෙනුවෙන් රුපියල් මිලියන 620ක් වැය කර ඇත. මෙය 1994 ට පෙර පැවැති තත්ත්වයේ සියයට 70ක වැඩිවීමකි.

- විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා ගතකළ යුතු කාලය අවම කර ඇත.

**සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකටම එක් ජාතික පාසලක් ස්ථාපිත වීම පසුගිය සමයේ අධ්‍යාපනයේ දක්නට ලැබුණු සුවිශේෂ ලක්ෂණයක්.**

# ලක්ෂ ගණනකට නව නිවාස - පානීය ජලය


- පසුගිය හය වසර තුළ පවුල් ඒකක 239,767කට ස්ථිර නිවාස ලබා දෙන ලද අතර තවත් නව නිවාස 173,283ක වැඩ නිමවෙමින් පවතී.
- රුපියල් මිලියන 953ක් වැය කරමින් දිවයින පුරා ජනඋදන ගම්මාන 500ක් ඉදිකර ඇත.



- "තිරසර පුරවර" වැඩ සටහන යටතේ බොරැල්ලේ සහශ්‍රපුර නිවාස 20,000ක් ද මිණිකැලණිපුර නිවාස 15,000ක් ද ඉදිකරන ලදී.
- නිවාස ඉදිකරගැනීම සඳහා විසිර ණය ක්‍රමය යටතේ රුපියල් මිලියන 1390ක ණය මුදල් නිකුත්කර ඇත.
- වතු නිවාස ඉදිකිරීම සඳහා රජය පසුගිය හය වසර තුළ දරා ඇති වියදම රුපියල් මිලියන 85කි.
- තාවකාලික නිවැසියන් උදෙසා ඇති කළ ප්‍රතිස්ථාපන නිවාස වැඩ පිළිවෙල යටතේ නිවාස ඉදිකිරීම සඳහා රුපියල් මිලියන 503ක් වියදම් කර ඇත.
- පූජනීය ස්ථාන 49ක් සංවර්ධනය කිරීම සඳහා රුපියල් මිලියන 227ක් වැය කරන ලදී.

- ජල සම්පාදන ව්‍යාපෘති සඳහා මේ වනවිට වැයකර ඇති මුදල රුපියල් කෝටි 1500ක් වන අතර මින් කෝටි 800ක් විදේශ ආධාර වේ.

- පසුගිය හය වසර තුළ පමණක් පවුල් ඒකක 206,500ක් සඳහා නව ජල සම්බන්ධතා ලබා දී ඇත.




- ග්‍රාමීය ජලසම්පාදන යෝජනා ක්‍රම යටතේ පසුගිය හයවසර තුළ පමණක් ලක්ෂ 20ක ජනතාවකට පානීය ජලය ලබාදී ඇත.

- ඉඩම් ගොඩකිරීම හා සංවර්ධනය යටතේ නව පාලම් 31ක් ඉදිකිරීම හා ඇල ඉවුරුවල පදිංචි පවුල් 5500ක් පුනරුත්ථාපනය සඳහා දරන ලද වියදම රුපියල් මිලියන 11,703කි.

- ග්‍රාමීය ජනතාවගේ ජීවන තත්වය උසස් කිරීමට සනීපාරක්ෂක හා ජලසම්පාදන පහසුකම් ලබා දීමට රුපියල් මිලියන 1368ක ලෝක බැංකු ආධාර ඇතුළුව රුපියල් මිලියන 2570ක් වියදම් දරා ඇත.

- අම්බලන්ගොඩ, රත්නපුර, පොළොන්නරුව, ආදී නගර 17ක යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වූ උප ව්‍යාපෘති 48ක් වෙනුවෙන් රුපියල් මිලියන 204ක් වැයකර ඇත.

- 1999 වසරේදී පමණක් රුපියල් මිලියන 500කට අධික නිවාස ණය ප්‍රමාණයක් සහනදායී පදනම යටතේ ලබා දී ඇත.
- රුපියල් මිලියන 741ක වියදමින් බේරේ වැව ප්‍රතිසංස්කරණ වැඩකටයුතු අරඹන ලදී.




- මුතුරාජවෙල, කොලොන්නාව ප්‍රදේශයේ වගුරුබිම් හා ඇල මාර්ග සංවර්ධන ව්‍යාපෘති සඳහා රුපියල් මිලියන 90ක් වැයකර ඇත.
- ආසියානු සංවර්ධන බැංකු ආධාර සහිතව අනුරාධපුර, කළුතර, කෑගල්ල, මොණරාගල, පුත්තලම හා හම්බන්තොට යන දිස්ත්‍රික්කයන්හි ක්‍රියාත්මක කළ ග්‍රාමීය ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘති මගින් දශ ලක්ෂයකට අධික ජනතාවකට සෙත සැලසේ.
- දිවයින පුරා පාසැල් 707කට ජල සම්පාදන හා සනීපාරක්ෂක පහසුකම් ලබා දී ඇත.

**දීපව්‍යාප්ත ජල සම්පාදන ව්‍යාපෘති,<br>නිවාස යෝජනා ක්‍රම හා ක්‍රමවත්<br>යටිතල පහසුකම් සඳහා<br>කැපී පෙනෙන දයකත්වයක්<br>පසුගිය හය වසර තුළ<br>ලබා දී ඇත.**

කර්මාන්ත සංවර්ධන
අමාත්‍යංශය

# නව ආයෝජන - නව රැකියා අවස්ථා

- ආයෝජකයින් දිරිගැන්වීමට ප්‍රදානය කළ සිත්ගන්නා සුළු නව සහන මත 2000 ජූනි වන විට අලුතින් කර්මාන්ත 192ක් ආරම්භ කර ඇති අතර පවත්නා කර්මාන්ත 433 වැඩි දියුණු කර ඇත.



- නව කර්මාන්ත සඳහා වූ ආයෝජනය රුපියල් බිලියන 11.6ක් වන අතර එමගින් රැකියා අවස්ථා 50,000කට අධික ප්‍රමාණයක් ඇති විය.
- 1998 දී ඇති කරන ලද ඇඟලුම් කර්මාන්ත 50 ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 2550ක් ආයෝජනය කළ අතර එමගින් රැකියා අවස්ථා 100,000කට අධික ප්‍රමාණයක් උදවිය.
- සීතාවක, මීරිගම ඇතුලු කර්මාන්තපුර 11ක් ඇරඹීම තුළින් ග්‍රාමීය රැකියා අවස්ථා වැඩි වූ අතර එය කර්මාන්ත ක්ෂේත්‍රයේ පුනර්ජීවයක් ඇති වීමට හේතු විය.
- 1994 දී රුපියල් බිලියන 68ක් වූ අපනයන ආදයම 1999 වන විට රුපියල් බිලියන 155 දක්වා වර්ධනය වී ඇත.
- දළ දේශීය නිෂ්පාදනයට කර්මාන්ත අංශයේ දයකත්වය 1994-98 කාලය තුළ සියයට 35.5 කින් වර්ධනය වී ඇත.

- නැගෙනහිර ආසියානු අර්බුදයන් තුළ වුවද කර්මාන්ත ක්ෂේත්‍රයේ වර්ධනයක් පවත්වා ගනිමින් සේවා වියුක්තිය සියයට 13 සිට සියයට 8 දක්වා අඩු කරන ලදී.
- අක්කර 415ක විහිදුනු සීතාවක කර්මාන්ත පුරය වෙනුවෙන් වැය කළ මුළු වියදම රුපියල් බිලියන 3.6කි. ස්ථාපිත ව්‍යාපෘති ගණන 71කි.



- බට අත-අම්බලන්තොට අන්තර් ජාතික තත්ත්වයේ සම් කර්මාන්ත සංකීර්ණයක් රුපියල් මිලියන 232 වියදමින් ඉදිකිරීමට කටයුතු ආරම්භ කරන ලදී.
- ප්‍රාදේශීය කර්මාන්ත ජනපද සංවර්ධන වැඩසටහන යටතේ කර්මාන්ත ජනපද නවයකට අදල සංවර්ධන කටයුතු නිමකර ඇති අතර මෙමගින් අපේක්ෂිත සේවා නියුක්තිය 121,200කි.
- විශේෂිත ආර්ථික වෙළෙඳ මධ්‍යස්ථාන පිහිටුවීමේ වැඩ සටහන යටතේ මරදගහමුල සහල් තොග වෙළෙඳ කටයුතු සඳහාත්, දඹුල්ල එළවලු තොග වෙළෙඳ කටයුතු සඳහාත් වෙළෙඳ මධ්‍යස්ථාන 2ක් ඉදිකරන ලදී.
- ඇඹිලිපිටිය, මොණරාගල, කැප්පෙටිපොළ සහ පමුණුව යන ස්ථාන වල ආර්ථික වෙළෙඳ මධ්‍යස්ථාන පිහිටුවීමට යෝජිතයි.
- දේශීය අත්යන්ත්‍ර රෙදිපිළි කර්මාන්තය දිරි ගන්වමින් සියයට 20ක සහනාධාරයක් සහිතව එම නිෂ්පාදන රාජ්‍ය අංශය වෙත අලෙවි කිරීමට පහසුකම් සළස්වා ඇත.

- 1994 සිට 1998 දක්වා කාර්මික හා ඛණිජ අපනයන වටිනාකම සියයට 53.6 කින් වැඩි වී ඇත.

- 1998 -99 වසර තුළ පමණක් දිස්ත්‍රික්ක මට්ටමින් රුපියල් මිලියන 333ක් ආයෝජනය කරමින් විවිධ කර්මාන්ත 957ක් ඇති කිරීමටත් එමගින් සෘජු රැකියා අවස්ථා 3638ක් බිහිකිරීමටත් කටයුතු කෙරිණි.

| ඇඟලුම් අපනයනයේ වර්ධනය | |
|---|---|
| වර්ෂය | රුපියල් බිලියන |
| 1994 | 68.9 |
| 1995 | 84.8 |
| 1996 | 98.9 |
| 1997 | 121.0 |
| 1998 | 142.3 |
| 1999 | 155.2 |

- 2005 වර්ෂය වන විට පංගු වලින් තොර අන්තර් ජාතික වෙළෙඳ පොළකට නැඹුරු වන සේ ඇඟලුම් අංශය ශක්තිමත් කිරීමට පදනම සකසා ඇත.


- 1994 වසරේදී ඇමරිකානු ඩොලර් 656 ක් වූ ඒක පුද්ගල ආදායම 1998 වසරේ දී ඇමරිකානු ඩොලර් 837 දක්වා වර්ධනය වීම කෙරෙහි දායක වූ ප්‍රධාන සාධකය වනුයේ කර්මාන්ත අංශයේ සිදු වූ ව්‍යාප්තිය හා වර්ධනයයි.

**ගෝලීය තරඟකාරීත්වයට මුහුණ දියහැකි හිතකර පරිසරයක් තුළ කර්මාන්ත ක්ෂේත්‍රයේ සංවර්ධනයක් හා වැඩි විදේශ විනිමය ආදායමක්.**

සෞඛ්‍ය
අමාත්‍යාංශය

# ආසියාවේ විශාලම ළමා රෝහල

- බොරැල්ලේ රිජ්වේ ළමා රෝහල රුපියල් බිලියන දශ ලක්ෂ පන්සීයක වියදමින් ආසියාවේ විශාලතම ළමා රෝහල වශයෙන් මෑතකදී විවෘත කරන ලද්දේ සියළු නවීන පහසුකම් සහිතවය.



- 1994 දී 3496ක් වූ මෙරට වෛද්‍යවරුන්ගේ සංඛ්‍යාව 1999 වන විට 5957 දක්වා වැඩි වී ඇති අතර දේශීය වෛද්‍යවරුන්ගේ සංඛ්‍යාව 717කින් වැඩි වී ඇත.

- රුපියල් මිලියන 1500ක වියදමින් අනුරාධපුරය, මහනුවර හා බදුල්ල රෝහල්වල පිළිකා ඒකක පිහිටුවන ලදී.

- ආසියාවේ වැඩිම පහසුකම් සහිත දන්ත වෛද්‍ය ඒකකය පේරාදෙණිය ශික්ෂණ රෝහලේ ස්ථාපිත විය.

- ගාල්ල රෝහලට හෘද ශල්‍ය ඒකකයක්, මහනුවර ශික්ෂණ රෝහලට වකුගඩු ඒකකයක් හා හෘද ශල්‍ය ඒකකයක් ස්ථාපිත කරමින් සෞඛ්‍ය සේවාවන් වඩාත් ව්‍යාප්ත කරන ලදී. මේ සඳහා දරන ලද වියදම රුපියල් මිලියන 450කි.

- ආසියානු සංවර්ධන බැංකුව හා කොරියන් ආධාර යටතේ මීගමුව, ගම්පහ සහ කළුබෝවිල රෝහල් නවීකරණය විය.

- 1994 දී සෞඛ්‍ය සේවා සඳහා රජය දරන ලද වියදම 1999 වන විට රුපියල් බිලියන 12.5 දක්වා වැඩිකරන ලදී.



- ළමා සෞඛ්‍ය පිළිබඳව රජයේ වූ දැඩි අවධානය නිසා ළමා ප්‍රතිශක්තිකරණ වැඩපිළිවෙළ ලෝකයේ සංවර්ධිත රටවල මට්ටමට පැමිණ ඇත.

- ආසියානු සංවර්ධන බැංකු ආධාර සහිතව ගිලන් රථ 200ක් ග්‍රාමීය රෝහල් වෙත බෙදා දී ඇත.

- ජනාධිපති කාර්ය සාදක නිර්දේශ මත අනුරාධපුර, පල්ලෙකැලේ ආයුර්වේද රෝහල් රුපියල් මිලියන 20ක් වැයකර වැඩි දියුණු වේ.

- ග්‍රාමීය ජනතාවට වඩාත් හිතකර සෞඛ්‍ය සේවාවක් ලබාදීමේ අරමුණින් සුව උදාන වෛද්‍ය වැඩ සටහන ක්‍රියාවට නගන ලදී. මෙම වැඩ සටහනින් 238720ක් නොමිලේ වෛද්‍ය පහසුකම් ලබාගෙන ඇත.

**සෑම දිස්ත්‍රික්කයකටම අංග සම්පූර්ණ රෝහලක්.**
**ජනතාවට කාර්යක්ෂම වෛද්‍ය සේවාවක්.**
**වෛද්‍ය සේවාවේ පුළුල් වර්ධනයක්.**

ප්‍රවාහන හා මහා මාර්ග අමාත්‍යාංශය

# ප්‍රථම වරට ගුවන් මාවත්

- මහාමාර්ග සංවර්ධනයට 1995 සිට 2000 දක්වා රජය රුපියල් මිලියන රු. 31,205 වැය කරයි.
- වාහන තදබදයට විසඳුමක් ලෙස ප්‍රථම වරට රාගම හා දෙමටගොඩ ගුවන් මාවත් ඉදිකෙරේ.



- පිවිසුම් පහක් සහිත බොරැල්ල උමං මාර්ගය සහ මහනුවර උමං මාර්ගය ඉදිකිරීම.
- කොළඹ-කටුනායක, කොළඹ- මාතර, කොළඹ-නුවර හා කොළඹට පිවිසීමේ අධිවේගී මාර්ගවල මූලික වැඩ කටයුතු ආරම්භ කෙරේ. ඇස්තමේන්තුගත වියදම රුපියල් මිලියන 1000කි.
- ක්වේට්, ජපන් හා ලෝක බැංකු ආධාර යටතේ දිවයින පුරා අළුතින් ඉදිකළ හා පුනරුත්ථාපනය කළ පාලම් ගණන 196කි.
- ප්‍රථම වරට දේශීය තාක්ෂණය හා ශිල්පක්‍රම උපයෝගී කරගනිමින් මාර්ග සංඥා පද්ධති ස්ථාපිත කර ඇත.
- දුම්රිය ප්‍රවාහන සේවා කාර්යක්ෂම කරමින් දුම්රිය බලවේග කට්ටල ඇතුළුව නව දුම්රිය එන්ජින් 34ක් දුම්රිය පද්ධතියට එක්වේ.

- කැලණිවැලි දුම්රිය මාර්ගය අවිස්සාවේල්ල දක්වා පුළුල් දුම්රිය මාර්ගයක් බවට පත්කිරීමත්, රාගම-මීගමුව අතර ඉදිවෙන දෙවන දුම්රිය මාර්ගයත් මගී ප්‍රවාහනයේ තදබදයට විසඳුමකි.

- පොදු ගමනා ගමනය සඳහා අලුතින් එක් වූ නව බස් රථ ප්‍රමාණය 5555කි. ඊට අමතරව බස් රථ 2200ක් පුනරුත්ථාපනය කර ධාවනයට යොදවනු ලැබීය.



- පාසැල් සිසුන්ගේ අධ්‍යාපන කටයුතුවලට සහනයක් සළසමින් පාසැල් සිසුන් වෙනුවෙන් නිකුත් කෙරෙන වාර ප්‍රවේශ පත්‍ර ගාස්තුව සියයට 10කින් අඩු කෙරිණි.

- ග්‍රාමීය ප්‍රදේශවල ප්‍රවාහන සේවා වර්ධනය කිරීමේ අරමුණින් ඉන්දියාවෙන් ආනයනය කරනු ලැබූ කුඩා බස් රථ 200ක් ග්‍රාමීය ප්‍රදේශවල ධාවනයට යොදවන ලදී.


- 1999 වර්ෂය තුළ පමණක් නව උප දුම්රිය ස්ථාන 10ක් විවෘත කරන ලද අතර විදුලි සංඥා පහසුකම් සෑම ප්‍රධාන දුම්රිය මාර්ගයකම ස්ථාපිත කර ඇත..

**ගුවන් පාලම්, උමං මාර්ග, අධිවේගී මාර්ග ප්‍රවාහන ක්ෂේත්‍රයේ සුවිශේෂී සංවර්ධන ව්‍යාපෘති ලෙස සටහන් වේ.**

කම්කරු
අමාත්‍යාංශය

# විදේශ රැකියා ඉහළම ආදයම් මාර්ගයක්

- 1994 සිට 1999 දක්වා විදේශ රැකියා සඳහා පිටත් වූවන්ගේ සංඛ්‍යාව ලක්ෂ 7 ඉක්මවයි.
- 1994 දී රුපියල් මිලියන 34,992 ·ක් වූ විදේශ රැකියා මගින් ඉපැයූ විදේශ විනිමය ප්‍රමාණය 1999 වසරේ දී රුපියල් මිලියන 74,342 දක්වා වැඩි වී ඇත.



- විදේශ රටවල ගෘහ සේවකයන්ගේ හා ඇහලුම් සේවිකාවන්ගේ අවම වැටුප රුපියල් 10,140 දක්වා (ඇ. ඩො. 130) වැඩි කිරීමට හැකි වීම.
- විදේශ රැකියා නියුක්තිකයන්ට සුරක්ෂා රක්ෂණ සහ පවුල් රක්ෂණ ක්‍රම ක්‍රියාත්මක කරන ලදී.
- ගෘහ සේවිකාවන්ට පුහුණුව ලබා දීම සඳහා පුහුණු මධ්‍යස්ථාන 20ක් දිවයින පුරා අරඹන ලදී.
- ගෘහ සේවිකාවන්ගේ රැකියා සුරක්ෂිත භාවය තහවුරු කිරීම සඳහා කොන්ත්‍රාත් ගිවිසුම් ක්‍රමයක් හඳුන්වා දෙන ලදී.
- රැකියා සඳහා විදේශ ගත වන්නන්ගේ ලියාපදිංචි ගාස්තු භාණ්ඩ හා සේවා බද්දෙන් නිදහස් කිරීම.

- සේවක අර්ථසාධක අරමුදලේ දායකත්වය රුපියල් මිලියන 61 සිට 74 දක්වා වැඩි කිරීමට හැකි වීම.

- අර්ථසාධක අරමුදලේ ඉතුරුම් ආදායම් බද්දෙන් නිදහස් කරන සීමාව රුපියල් 200,000 සිට රුපියල් 400,000 දක්වා ඉහළ නැංවීම.




- ගෙවන ලබන පාරිතෝෂික මුදලින් බදු අය නොකරන සීමාව රුපියල් 400,000 සිට රුපියල් 510,000/= දක්වා ඉහළ නැංවීම.

- කම්කරු අධ්‍යාපන ආයතන ස්ථාපනය කිරීම හා කම්කරු විනිශ්චය සභා වැඩි කිරීම.

- කාර්මික ආරක්ෂාව හා වෘත්තීය අනතුරු වැළැක්වීමට නව රෙගුලාසි පැන වූ අතර ළමා ශ්‍රමිකයින් ඉන් මුදවා ගැනීමට ජනාධිපති කාර්ය සාධක බලකායක් පත් කෙරිණි.

- සෑම ප්‍රධාන වෘත්තියකටම පඩිපාලක සභාවක් ස්ථාපිත කිරීම.

**විදේශ රැකියා නියුක්තිකයන්ගේ සුරක්ෂිතතාව වැඩි දියුණුවීම, පෞද්ගලික අංශයේ සෑම රැකියා ක්ෂේත්‍රයකම පඩිපාලක සභා පිහිටුවීම කැපීපෙනේ.**

# ලොව හොඳම වරායවල් අතරට කොළඹ වරාය

- 1994 දී 972,642, ක්වූ කන්ටේනර් මෙහයුම් ප්‍රමාණය 1704,389 දක්වා ඉහළ නංවා ගැනීමට හැකිවේ.
- 1994 දී රුපියල් මිලියන 527 ක් වූ වරායේ ලාභය 1999 වන විට රුපියල් මිලියන 5252 දක්වා වැඩි වී ඇත.



- රටට අවශ්‍යව තිබූ තෙල් නළ මාර්ග පද්ධතිය සමග නව තෙල් නැංගුරම් පළක් රුපියල් මිලියන 3390ක වියදමින් ඉදිකරන ලදී.
- පෑලියගොඩ කන්ටේනර් මෙහෙයුම් මධ්‍යස්ථානය රුපියල් මිලියන 600ක වියදමින් ඉදිකිරීම නිසා වරාය තදබදය අඩු කිරීමට හැකි විය.
- වරාය ආශ්‍රිත නව කර්මාන්ත ඇරඹිණ. නැව් බඩු මෙහෙයවීම වරායෙන් පිටතට ගෙන යෑම නිසා නව වැඩි වශයෙන් ආයෝජකයන් ගෙන්වා ගැනීමට හැකි විය.
- පෞද්ගලික අංශයේ ද සහයෝගය සහිතව ඇ. ඩො. මිලියන 240ක වියදමින් රැජින පාලම සංවර්ධනය කරන ලදී.
- රුපියල් මිලියන 7358ක වියදමින් ජය බහලු පර්යන්තයෙහි අදියර 3 හා 4 නිම කිරීමෙන් වරාය කාර්යක්ෂමතාව වැඩි කිරිමට හැකි විය.

- අවතැන් වූ පවුල් සඳහා 1994 දී ගෙවූ රුපියල් 500ක්වූ ආධාර මුදල 1999 වන විට රුපියල් 700 දක්වා වැඩිකර ඇත.
- සුභ සාධන මධ්‍යස්ථානවල ජීවත්වන තරුණ තරුණියන්ගේ විවාහවීමේ දී ගෙවනු ලබන දීමනාව රුපියල් 25,000 දක්වා වැඩි කර ඇති අතර මෙමගින් පවුල් 1370කට රුපියල් ලක්ෂ 300ක් දනට ගෙවා ඇත.



- අවතැන් වූවන් සඳහා ආදර්ශ ගම්මාන 29ක් විවෘත කර 35,393ක වූ පිරිසක් පදිංචි කර ඇත.
- භීෂණ සමයේ ඇතුරුදහන්වූවන් වෙනුවෙන් රුපියල් මිලියන 480ක් වන්දි වශයෙන් ගෙවා ඇත.
- අවතැන් වූවන්ගේ තාවකාලික නිවාස සාදාගැනීම සඳහා දීමනාවක් වශයෙන් රුපියල් මිලියන .171 ක් ගෙවා ඇත.
- අවතැන් වූවන්ට ව්‍යාපාර කටයුතු ආරම්භ කිරීමට රුපියල් මිලියන 258ක් දීමනා වශයෙන් ගෙවා ඇත.
- සුභසාධන මධ්‍යස්ථාන තුළ ජීවත් වන සිසු සිසුවියනට අ. පො. ස උසස් පෙළ අධ්‍යාපන කටයුතු සඳහා රුපියල් 500 බැගින් වූ ශිෂ්‍යාධාර ලෙස රුපියල් 500,000ක් පමණ ගෙවා ඇත.

**කොළඹ වරාය ලොව හොඳ ම වරායවල් අතර 24 වන තැනට පත් කිරීමට හැකි වී ඇත. මීට ඉහත කොළඹ වරායට හිමි ව තිබුනේ 29 වැනි තැනයි.**

සමෘද්ධි, යෞවන කටයුතු හා ක්‍රීඩා
අමාත්‍යාංශය

# සමෘද්ධි බැංකු 918යි.
# ඉතිරි කිරීම් මිලියන 939යි.

- සමෘද්ධි ලාභින්ගේ ඉතිරිකිරීම් වැඩිකර ඔවුන් ආයෝජනවලට යොමුකිරීමේ අරමුණින් ඇතිකළ සමෘද්ධි බැංකු සංකල්පය බැංකු 918 දක්වා ව්‍යාප්තව ඇත.
- සමෘද්ධිලාභීන්ගේ ඉතිරිකිරීම් රුපියල් මිලියන 939 දක්වා වර්ධනය වී ඇති අතර සමෘද්ධි බැංකු මගින් ණය. ලබාගත් සංඛ්‍යාව 2,63936කි.



- සමෘද්ධි අනිවාර්ය ඉතිරිකිරීම් යටතේ මේ දක්වා ඉතිරිකර ඇති මුදල රුපියල් මිලියන 5908කි.
- සමෘද්ධි ණය වැඩ සටහන් යටතේ සංවර්ධන ණය යටතේ රුපියල් මිලියන 521ක් ද, ව්‍යවසායකත්ව ණය යටතේ රුපියල් මිලියන 265ක්ද, කුඩා කර්මාන්ත ණය යටතේ රුපියල් මිලියන 162ක්ද ලබා දී ඇත.
- සමෘද්ධි ප්‍රතිලාභි පවුල් එක් රැස්කර පෞද්ගලික ව්‍යවසායකයන්ගේ සහභාගිත්වයෙන් ජනතා සමාගම් පිහිටුවන ලද අතර මෙම සමාගම් මගින් ඇරඹූ කර්මාන්ත තුළින් පවුල් 4100කට ප්‍රතිලාභ හිමි වී ඇත.
- රුපියල් මිලියන 2106 වියදමින් සමෘද්ධි ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති 53,716 දිවයින පුරා ක්‍රියාවට ඇත.

- සමෘද්ධි සමාජ ආරක්ෂණ අරමුදල යටතේ උපත්, විවාහ, රෝගී හා මරණ අවස්ථා 165,104 වෙනුවෙන් රුපියල් මිලියන 420.16ක ප්‍රතිලාභ ලබාදී ඇත.

- සමෘද්ධිලාභී පවුල් ලක්ෂ 19ක් සඳහා සහනාධාර වශයෙන් රුපියල් මිලියන 8190 ක් රජය වාර්ෂිකව වැය කරයි.



- රුපියල් මිලියන 1766 අතිරේක වියදමක් දරමින් 2000 වසරේ අගෝස්තු මස සිට සමෘද්ධි සහනාධාර මුදල වැඩි කර ඇත.

- සමෘද්ධි නැණ නුවන අධ්‍යාපන වැඩ සටහන මගින් 2000 වසර සඳහා පමණක් රුපියල් මිලියන 8ක් වැය කරමින් අධ්‍යාපන ශිෂ්‍යත්ව 1738ක් ලබාදීමට කටයුතු කර ඇත.

- සමෘද්ධි ශ්‍රම ශක්ෂම වැඩ සටහනට අනුව වැව් පිළිසකර කිරීම යටතේ කුඩා වැව් 209ක්ද, සුළු වාරිමාර්ග 656ක්ද, කෘෂි ළිං 61, ඉදිකර ඇත. එමගින් වගාකළ ඉඩම් අක්කර ප්‍රමාණය 45171කි.

- සමෘද්ධි නියාමක සුභසාධන අරමුදල පිහිටුවීම තුළින් සමෘද්ධි සංවර්ධන නිලධාරීන් හා ඔවුන්ගේ පවුල් 21750 කට ප්‍රතිලාභ ලබා දී ඇත.

- තරුණ සංවර්ධන වැඩ සටහන් වෙනුවෙන් 1994 දී රජය රුපියල් මිලියන 175 ක් වියදම් කළ අතර, මෙම ප්‍රමාණය 1999 දී 324 දක්වා වැඩි කර ඇත. මෙය 1994 වඩා සියයට 285ක වැඩිවීමකි.


- ගමින් ගමට විශ්ව පුස්තකාල වැඩ සටහන යටතේ තරුණ සේවා පුස්තකාල 3838ක් දිවයින පුරා පිහිටුවේ.
- පසුගිය වසර හය තුළ නිස්කෝ ණය මගින් ස්වයං රැකියාලාභීන් 4314 කට රුපියල් මිලියන 43ක ණය ලබා දී ඇත.



- පෞද්ගලික අංශය සමඟ ඒකාබද්ධව ආරම්භ කළ රැකියා වෙළෙඳ පොළ යටතේ තරුණ තරුණියන් 31308 දෙනෙකු රැකියා සඳහා යොමු කර ඇත.
- නව සියවසට ගැලපෙන තරුණ පරපුරක් බිහිකිරීමේ හා කාලීන දැනුමෙන් තරුණ පරපුර පරිපූර්ණ කිරීමේ අරමුණින් 'සහශ්‍රා' නමින් තොරතුරු මධ්‍යස්ථානයක් පිහිටුවීම.
- 1994 දී තරුණ සංවර්ධන ව්‍යාපෘති වෙනුවෙන් ලබාදී තිබූ රුපියල් මිලියන 3.3ක් වූ මුදල 2000 වසරේ දී ව්‍යාපෘති 224 සඳහා රුපියල් මිලියන 8ක් දක්වා වැඩි කර ඇත.
- 1995 දී ක්‍රීඩා සංවර්ධනය වෙනුවෙන් වැය කළ රුපියල් මිලියන් 8.4 ක් වූ මුදල 1999 වන විට රුපියල් මිලියන 90 දක්වා වැඩි කර ඇත.
- 1999 දී රුපියල් මිලියන 3.7ක වියදමින් ඇති කළ ක්‍රීඩා පෝෂණ ශිෂ්‍යත්ව ක්‍රමය යටතේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් 2974 දෙනෙකුට දීමනා ප්‍රදානය කර ඇත.

- දේශීය ක්‍රීඩා තාක්ෂණය අන්තර්ජාතික මට්ටමකට ගෙන ඒම සඳහා ජාතික ක්‍රීඩා විද්‍යාතනයක් රුපියල් මිලියන 40ක වියදමින් ඉදිකර ඇත.

- 1995 සිට පසුගිය වසර දක්වා රුපියල් මිලියන 65ක් පමණ වැය කර ශ්‍රී ලංකා ක්‍රීඩක ක්‍රීඩිකාවන් විශාල පිරිසක් ජාත්‍යන්තර තරග සඳහා සහභාගි කරවනු ලැබිය.




- 1996 දී ලෝක ක්‍රිකට් ශුරතාව දිනා ගැනීම හා ආසියානු නෙට් බෝල් ශුරතාව දිනා ගැනීම.

- ජාතික මට්ටමේ ක්‍රීඩක ක්‍රීඩිකාවනගේ ජීවන මට්ටම හා පුහුණු කටයුතු ක්‍රමවත්ව පවත්වාගෙන යෑම සඳහා රජයේ මැදිහත්වීම මත පෞද්ගලික අනුග්‍රාහකයන් ලබාදීමට පියවර ගෙන ඇත. මෙම වැඩ පිළිවෙළ යටතේ පසුගිය කාලසීමාව තුළ ක්‍රීඩක ක්‍රීඩිකාවන් ට ලබාදෙන ලද සමස්ත අනුග්‍රාහකත්ව වටිනාකම රුපියල් මිලියන 175 ක් පමණ වේ.

**දිළිඳුකම පිටු දකිමින්, විරැකියාව අවම කරමින්, තරුණ ශක්තිය ඔප නැංවූ හය වසරක්.**

# සෑම දුරකථන තුනකින්ම දෙකක් පසුගිය පස් වසර තුළ

තැපැල් විදුලි සංදේශ හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

- 1994 දී 1,80,724ක් වූ දුරකථන ග්‍රාහක සංඛ්‍යාව මේ වනවිට 8,50,000 ඉක්මවා ඇත.
- පොදු දුරකථන පහසුකම් වැඩිකරමින් 1994 දී 693ක් වූ ශ්‍රී ලංකා ටෙලිකොම් කාසි පෙට්ටි දුරකථන සංඛ්‍යාව 1999 වනවිට 2082 දක්වා වැඩිවේ.



- 1995 වසර හා සසඳන විට 1999 වසරෙදි ජංගම දුරකථන සංඛ්‍යාව සියයට 78 කින්ද, පෞද්ගලික දුරකථන සේවා ග්‍රාහක සංඛ්‍යාව සියයට 83 කින්ද වැඩි වී ඇත.
- යාපනය මුදවා ගැනීමෙන් පසු එම ප්‍රදේශවලට ලබාදුන් දුරකථන සංඛ්‍යාව 1500ක් වූ අතර ඉන් 1000කට අධික ප්‍රමාණයකට සෘජු ඇමැතුම් පහසුකම් සපයා ඇත.
- ග්‍රාමීය ප්‍රදේශවලට දුරකථන සැපයීම සඳහා 1997 හඳුන්වා දුන් රැහැන් රහිත දුරකථන සේවාව මගින් 1999 ජූලි මස වනවිට ග්‍රාහකයින් 11,084කට දුරකථන පහසුකම් සපයා ඇති අතර නව රැකියා අවස්ථා 772ක් ඇති විය.
- 1995 වසරෙදි 634ක් ව පැවැති ඉන්ටර්නෙට් හා ඊ මේල් සේවා මේ වනවිට 21751 දක්වා වැඩි වී ඇත.
- පසුගිය හය වසර තුළ ප්‍රධාන තැපැල් කාර්යාල, උප තැපැල් කාර්යාල හා නියෝජිත තැපැල් කාර්යාල 283කින් වැඩි වී ඇත.

- 1994 දී සියයට 50කට ආසන්න උප තැපැල් කාර්යාල ප්‍රමාණයකට ලබා දී තිබූ දුරකථන පහසුකම් සංඛ්‍යාව මේ වනවිට සියයට 72කට වැඩි කර ඇත.

- ෆැක්ස් මගින් මුදල් ඇනවුම් යැවීමේ සේවාව තැපැල් කාර්යාල 190ක් සඳහා ව්‍යාප්ත කර ඇති අතර විද්‍යුත් තැපැල් පහසුකම් මෙම වසර තුළ තැපැල් කාර්යාල 28ක් සඳහා ලබාදීමට යෝජිතයි.



- ජාත්‍යන්තර අධිවේගී තැපැල් සේවාව රටවල් 59ක් දක්වා ව්‍යාප්ත කර දේශීය අධිවේගී තැපැල වඩාත් කාර්යක්ෂම කර ඇත.

- උප තැපැල් ස්ථානාධිපතිවරුන් සඳහා විශ්‍රාම වැටුප් සහිත රාජ්‍ය සේවා තත්ත්වය ප්‍රදානය කරන ලදී.

- 21 වන සියවසට ගැලපෙන අයුරින් මධ්‍යම් තැපැල් හුවමාරුව නවීකරණය කිරීම.

- ප්‍රථම වරට ජනමාධ්‍යවේදීන් සඳහා රිච්ඩ් ද සොයිසා නමින් නිවාස සංකීර්ණයක් ඉදිකරන ලදී.

- මාධ්‍යවේදීන්ට විශේෂිත වූ ' පත්හිද ' නමින් රක්ෂණ ක්‍රමයක් ආරම්භ කෙරිණි.

- පුද්ගලික විද්‍යුත් මාධ්‍ය ආයතනවලට ස්වාධීනව ප්‍රවෘත්ති විකාශනයන් සඳහා අවකාශ සළසනු ලැබීය.

- මාධ්‍ය නිදහස තහවුරු කරමින් ඔවුනට නිදහසේ තම කාර්යයන් කර ගෙන යෑමේ පරිසරයක් සකස් කරනු ලැබීය.



- පාර්ලිමේන්තු බලතල හා වරප්‍රසාද පනත ඉවත්කිරීම තුළින් මාධ්‍යවේදීන්ගේ මාධ්‍ය නිදහස තවදුරටත් තහවුරු කර ඇත.

- ප්‍රාදේශීය සංවර්ධනය පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම සඳහා දිස්ත්‍රික් මාධ්‍ය ඒකක පිහිටුවා පරිගණක පද්ධතියක් තුළින් තොරතුරු ලබාගැනීමේ කටයුතු යොදා ඇත.

- ජනමාධ්‍යවේදීන්ගේ නිපුණතා වර්ධනය කිරීමේ අරමුණින් ජාතික හා ප්‍රාදේශීය මට්ටමෙන් පුහුණු පාඨමාලා සංවිධානය කිරීම.

- රාජ්‍ය හා පෞද්ගලික විද්‍යුත් මාධ්‍ය ආයතනවල විකාශන ජාලයන් පසුගිය වසර කිහිපය තුළ වර්ධනය කිරීමට ඉඩ ප්‍රස්ථා සැළසීම.

**මාධ්‍ය නිදහස තහවුරු කරමින්**
**සන්නිවේදනයේ නව තාක්ෂණයන්**
**හඳුන්වා දෙමින් 21 සියවසේ**
**අභියෝග ජයගත හැකි**
**පදනමක්**

සංස්කෘතික
අමාත්‍යාංශය

# දිස්ත්‍රික් සංස්කෘතික මධ්‍යස්ථාන 50ක්

- එක් මධ්‍යස්ථානයට රුපියල් ලක්ෂ 30 බැගින් දිවයින පුරා ඉදිකිරීමට යෝජිත සංස්කෘතික මධ්‍යස්ථාන 250ක් අතරින් දැනටමත් මධ්‍යස්ථාන 50ක වැඩ නිමවා ඇත.



- ආර්ථික අපහසුතාවයෙන් පෙළෙන වයෝවෘද්ධ කලාකරුවන් වෙනුවෙන් ලබාදෙනු ලබන මාසික දීමනාව රුපියල් 1800 දක්වා වැඩිකරමින් කලාකරුවන් 1400කට ප්‍රතිලාභ සලසයි.

- ජනාධිපති අරමුදලින් රුපියල් මිලියන 20ක් ප්‍රථම වරට කලාකරුවන්ගේ සුභසාධනය වෙනුවෙන් වෙන්කරයි. ප්‍රසාංගික කලාකරුවන් සඳහා ජනාධිපති සුභ සාධක අරමුදල 1977 දී ඇරඹූ අතර ඉන් කලාකරුවන් 153 දෙනෙක් මාසිකව රුපියල් 2000 බැගින් ප්‍රතිලාභ ලබයි.

- රුපියල් මිලියන 32.5ක වියදමින් පුරා විද්‍යා කෞතුගාරයක් හා තොරතුරු මධ්‍යස්ථානයක් පොළොන්නරුවේ ඉදිකෙරේ.

- කලාකරු ', ' කලාදේවි ' රක්ෂණ ක්‍රම මගින් කලාකරුවන් උදෙසා රක්ෂණ ප්‍රතිලාභ ලබාදීමට කටයුතු කළ අතර රක්ෂණ වාරික රජය මගින් ගෙවීමට කටයුතු කර ඇත.

- පාසැල් සිසුන් තුළ කලා හැකියාවන් වර්ධනය කිරීම සඳහා පාසල් නාට්‍ය පර්ෂද 15ක් ද ටවර් හෝල් රඟහල පදනම මගින් නාට්‍ය පාසලක් ද ආරම්භ කෙරිණි.
- රුපියල් මිලියන 15ක වියදමින් ජාතික මට්ටමේ සංචාරක නාට්‍ය කණ්ඩායමක් පිහිටුවයි.
- කලාකරුවන් 44 දෙනෙකුට ගල්කිස්ස කලාපුරයේ නිවාස තනා ගැනීම සඳහා ඉඩම් ලබා දී තිබේ.



- මුස්ලිම් ලේඛකයන් දිරිගැන්වීම සඳහා ඔවුන් විසින් ලියන ලද විවිධ කෘතීන් 5735කට රුපියල් ලක්ෂ 31ක මුදලක් ලබා දී ඇත.
- දකුණු ආසියාවේ පැරණි ම පුස්තකාල අතරින් එකක් වන ජාතික කෞතුකාගාරයේ පොත් සංරක්ෂණය සඳහා ජනාධිපති අරමුදලින් රුපියල් මිලියන 10ක් වැය කළ අතර කෞතුකාගාරයේ භාණ්ඩ පරිගණක ගත කර එහි ආරක්ෂාව සුරක්ෂිත කර ඇත.

**දිස්ත්‍රික් සංස්කෘතික මධ්‍යස්ථාන පිහිටුවීම හා ප්‍රසාංගික කලාකරුවන් සඳහා ජනාධිපති සුභසාධක අරමුදලක් පිහිටුවීම කැපී පෙනේ.**

- පාසැල් සිසුන් තුළ කලා හැකියාවන් වර්ධනය කිරීම සඳහා පාසල් නාට්‍ය පර්ෂද 15ක් ද ටවර් හෝල් රඟහල පදනම මගින් නාට්‍ය පාසලක් ද ආරම්භ කෙරිණි.
- රුපියල් මිලියන 15ක වියදමින් ජාතික මට්ටමේ සංචාරක නාට්‍ය කණ්ඩායමක් පිහිටුවයි.



- කලාකරුවන් 44 දෙනෙකුට ගල්කිස්ස කලාපුරයේ නිවාස තනා ගැනීම සඳහා ඉඩම් ලබා දී තිබේ.
- මුස්ලිම් ලේඛකයන් දිරිගැන්වීම සඳහා ඔවුන් විසින් ලියන ලද විවිධ කෘතීන් 5735කට රුපියල් ලක්ෂ 31ක මුදලක් ලබා දී ඇත.
- දකුණු ආසියාවේ පැරණි ම පුස්තකාල අතරින් එකක් වන ජාතික කෞතුකාගාරයේ පොත් සංරක්ෂණය සඳහා ජනාධිපති අරමුදලින් රුපියල් මිලියන 10ක් වැය කළ අතර කෞතුකාගාරයේ භාණ්ඩ පරිගණක ගත කර එහි ආරක්ෂාව සුරක්ෂිත කර ඇත.

**දිස්ත්‍රික් සංස්කෘතික මධ්‍යස්ථාන පිහිටුවීම හා ප්‍රසාංගික කලාකරුවන් සඳහා ජනාධිපති සුභසාධක අරමුදලක් පිහිටුවීම කැපී පෙනේ.**

විද්‍යා හා තාක්ෂණ
අමාත්‍යාංශය


# විකල්ප බලශක්තියෙන් විදුලි බලය

- හිනිදුම තෙළුව ප්‍රදේශයන්හි දුෂ්කර ගම්මාන සඳහා සුළං බලය යොදගනිමින් විදුලි බලය ලබාදෙයි.
- මුහුදු රළ උපයෝගී කර ගනිමින් කි. වො. 100ක විදුලි බල ධාරිතාවක් ලබා ගතහැකි ව්‍යාපෘතියක් ගාල්ලේ රුමස්සල ඇරඹේ.



- විකල්ප බලශක්තිය නිපදවා ගැනීම සඳහා ඉන්ධන දව ලබාගැනීමේ ව්‍යාපෘති දහයක් දිවයින පුරා ක්‍රියාත්මක වේ.
- දුෂ්කර පාසැල් සඳහා පරිගණක අධ්‍යාපනය ලබාදීමේ වැඩසටහන යටතේ පාසැල් 645කට පරිගණක යන්ත්‍ර 1795ක් සහ පරිගණක මුද්‍රණ යන්ත්‍ර 601ක් ලබා දෙන ලදී.
- මානව සම්පත් සංවර්ධනය කිරීමේ අරමුණින් ජාතික ආධුනිකත්ව පුහුණු මධ්‍යස්ථාන 36ක් පසුගිය වසර හය තුළ අළුතින් ආරම්භ කරන ලදී.
- පාසැල් සිසුන්ට තාරකා විද්‍යාව හා අභ්‍යවකාශ තොරතුරු හඳුන්වාදීමේ වැඩ පිළිවෙල යටතේ ජංගම ග්‍රහලෝකාගාරයක් පවත්වාගෙන යෑම.
- නයිටා ආයතනය යටතේ පරිගණක පුහුණු ආයතන 10ක් දිවයින පුරා පිහිටුවන ලදී.

- ගෘහ ආශ්‍රිත කර්මාන්ත, සුළු පරිමාණ නිෂ්පාදන හා ස්වයං රැකියා සඳහා අඩුවියදම් තාක්ෂණ ක්‍රම හඳුන්වාදීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කෙරේ.
- රුපියල් මිලියන 8.7ක විශේෂ උපකරණ සහිත කාලගුණ විද්‍යා තොරතුරු ඒකකයක් අළුතින් ඇරඹීම තුළින් නිවැරදි කාලගුණික තොරතුරු ලබාගත හැකි වීම.



- ආසියානු සංවර්ධන බැංකුව හා ඔපෙක් අරමුදලේ ආධාර ඇතිව විශ්ව විද්‍යාල 7ක් හා පර්යේෂණ ආයතන 5ක් මගින් ජාත්‍යන්තර මට්ටමේ විද්‍යාඥයින් බිහිකිරීමට පියවර ගෙන ඇත.
- විද්‍යාව හා තාක්ෂණය තරුණයන් අතර ජනප්‍රිය කිරීම සඳහා දීප ව්‍යාප්තව විද්‍යා හා තාක්ෂණ යොවුන් සමාජ ආරම්භ කළ අතර එමගින් සම්මන්ත්‍රණ සහ පුහුණු වැඩ මුළු පැවැත්වීම.
- ඉලෙක්ට්‍රොනික් දත්ත හුවමාරුව සඳහා ජාතික ප්‍රතිපත්තියක් සැකසේ.
- විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්ති සම්පාදනයට හා රටපුරා ක්‍රියාත්මක කිරීමට ජාතික විද්‍යා හා තාක්ෂණික කොමිසමක් ඇති කෙරේ.

**විධිමත් හා ඵලදායී විද්‍යා ප්‍රජාවක් බිහිකිරීමට**
**නව ලොව තාක්ෂණය ගමින් ගමට**

විදේශ කටයුතු
අමාත්‍යාංශය

# ජාතික මානව හිමිකම් කොමිසමක්

- ජාත්‍යන්තර ප්‍රජාව අතර බිඳවැටෙමින් තිබූ ශ්‍රී ලංකා ප්‍රතිරූපය නැවත යහපත් ආකාරයෙන් ගොඩනගා ගනිමින් ලොව පුරා ශ්‍රී ලංකාව කෙරෙහි විශ්වසනීයත්වයක් ගොඩ නැගීමට කටයුතු යෙදීම.



- දකුණු ආසියානු කලාපීය අසල් වැසි රටවල් සමඟ තිබූ ද්විපාර්ශ්වික සබඳතා කලක් ඉවතලා තිබුණ ද, පසුගිය සය වසර තුළ ක්‍රියාත්මක වූ විදේශ ප්‍රතිපත්ති හේතුවෙන් යළිත් සවිමත් නව සම්බන්ධතා ගොඩ නගා ගැනීමට හැකි වී ඇත.

- ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රබල ලෙස ස්ථාපිත කරමින් මානව හිමිකම් සුරකීමට රජය ගත් ක්‍රියාමාර්ග තානාපති කාර්යාල හරහා ජාත්‍යන්තර ප්‍රජාව වෙත ඉදිරිපත් කිරීම තුළින් නැවත වරක් ශ්‍රී ලංකාව මානව හිමිකම් සුරකින රටක් බවට තහවුරු කරන ලදී.

- පසුගිය වසර හය තුළ විදේශීය තානාපති කාර්යාල හරහා එල්. ටී. ටී. ඊ සංවිධානයේ සැබෑ තත්ත්වය ලොවට පැහැදිලි කරදීමේ ප්‍රබල උත්සාහය නිසා අද ඇමරිකාව, ඉන්දියාව, මැලේසියාව වැනි රටවල් තුළ එම සංවිධානය තහනම් කිරීමට කටයුතු යොදා ඇත.

- විදේශ රටවල ශ්‍රී ලාංකීය නිෂ්පාදන සඳහා නව විදේශ වෙළෙඳ පොළවල් හඳුන්වාදීම හා වෙළෙඳ ප්‍රවර්ධන කටයුතු සඳහා විශේෂ වැඩ සටහන් සංවිධානය කෙරිණි.
- ජාත්‍යන්තර වශයෙන් කරනු ලැබූ ප්‍රවර්ධන කටයුතු තුළින් විදේශීය ආයෝජකයින් විශාල ප්‍රමාණයක් ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීමට හැකිවිය.



- කාර්මික සහයෝගීතා ඒකකය මගින් ආසියාතු කලාපයේ දියුණු වෙමින් පවත්නා රටවලට තාක්ෂණික දැනුම හා සහාය ලබාගැනීමට පියවර ගෙන ඇත.
- කලාපීය සංවිධාන අතර අන්තර් සම්බන්ධතා දියුණු කරගැනීම තුළින් ගෝලීයකරණ සංකල්පය ඵලදායී ලෙස ක්‍රියාවට නැංවීමට හැකි විය.
- විදේශ රැකියාවල නියුතු ශ්‍රී ලාංකිකයන්ගේ ආරක්ෂාව හා සුභ සාධන කටයුතු සඳහා සෘජුව මැදිහත් වීමට හැකිවන පරිදි තානාපති කාර්යාල ශක්තිමත් කර ඇත.
- ජෝර්දානය, කටාර් රාජ්‍ය, ලෙබනනය, දකුණු අප්‍රිකාව, ඊශ්‍රායලය, පිලිපීනය වැනි රටවල නව තානාපති කාර්යාල විවෘත කරන ලදී.
- 1997 දී එක්සත් ජාතීන්ගේ ප්‍රධාන සැසිවාරයේ දී උප සභාපති වරයෙකු වශයෙන් ශ්‍රී ලංකාව ත්‍රස්තවාදී බෝම්බ ප්‍රහාර මැඩපැවැත්වීම සඳහා වූ සම්මුතිය සකස් කර ගැනීම සඳහා සෘජුව දායකවීම.

**ත්‍රස්තවාදයට එරෙහිව ජාත්‍යන්තර ප්‍රජාවගේ ප්‍රබල සහයක් ලබාගැනීමට හැකිවීම.**

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

රාජ්‍ය ආරක්ෂක
අමාත්‍යාංශය

# ආරක්ෂක හමුදාවන්ට අති නවීන අවි ආයුධ

- 1994 දී මිලියන 200 පමණ වූ ජාතික ආරක්ෂක අරමුදල 1999 ජූනි මස වනවිට මිලියන 610 දක්වා වර්ධනය වේ.
- ත්‍රස්තවාදයට එරෙහිව කරනු ලබන යුධමය කටයුතු සඳහා අති නවීන අවි ආයුධ ලබාදීම තුළින් ආරක්ෂක හමුද ශක්තිමත් කිරීම.



- උතුරු නැගෙනහිර කොටි ත්‍රස්තවාදී ග්‍රහණයට නතුව තිබූ මුළු භූමි ප්‍රමාණයෙන් සියයට 80ක් පමණ මුදවා ගැනීමටත්, යාපනය නගරය ඇතුළු ප්‍රදේශ ගණනාවක සිවිල් පරිපාලනය තහවුරු කිරීමටත් හැකිවිය.
- ආරක්ෂක අංශවලට ඉහළ වැටුප් ලබාදෙමින් රණවිරුවන් සහ ඔවුන්ගේ පවුල්වල සුභසාධනයට ද වැඩි අවධානයක් යොමු කෙරිණි.
- රණවිරුවන්ගේ සුභසාධක කටයුතු සඳහා රණවිරු අධිකාරිය පිහිටුවීම සහ නිවාස යෝජනා ක්‍රම මගින් රණවිරුවන් සඳහා නිවාස ලබාදීම.
- කොත්මලේ ද්‍රවිඩ භාෂා පුහුණු මධ්‍යස්ථානය මගින් ත්‍රිවිධ හමුද නිලධාරීන් 1480ක් මේ වනවිට පුහුණු කර ඇත.

- ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා ප්‍රමිතීන්ට අනුව ගුවන් ගමන් බලපත්‍රය නවීකරණය විය.
- 1994 සිට මේ දක්වා ගමන් බලපත්‍ර ලක්ෂ 18ක් නිකුත් කර ඇති අතර ඉන් ලද ආදායම රුපියල් මිලියන 4973කට ආසන්න වේ.



- ජාතික හැඳුනුම්පත් ලබාගැනීමට වඩාත් පහසුකම් සැළසීමේ අරමුණින් ජංගම සේවා 192ක් පවත්වා ඇත.
- ව්‍යාජ ගමන් බලපත්‍ර හඳුනාගැනීමට පහසුවන පරිදි හා ගමන් බලපත්‍ර ක්ෂණිකව මහජනතාවට ලබාගත හැකිවන පරිදි පරිගණක පද්ධතියක් ස්ථාපනය කරනු ලැබිය.
- කළුගල්, ගිනිපෙට්ටි හා ගිනි කෙලි කර්මාන්තය සඳහා පහසු හා සාධාරණ මිලකට ආනයනය කර සැපයීම සඳහා 1998 දී වැලිසර විශේෂ ඒකකයක් පිහිටුවන ලදී.
- 1997 සිට වගා ආරක්ෂණ කටයුතු සඳහා නැවතත් තුවක්කු 4000ක් පමණ මේ වනවිට නිකුත් කර ඇත.

**ඉතිහාසයේ දරුණුතම බේදවාචකය වී ඇති උතුරේ යුද්ධය නිමා කිරීම සඳහා අතිරේක වැය බරද නොසළකා ආරක්ෂක හමුදවන්ට අති නවීන අවි ආයුධ ලබාදීම සුවිශේෂයි.**

# මොරගහකන්ද ජලාශය ඉදිවේ

- ක්වේට් රජයේ ආධාර යටතේ මොරගහකන්ද ජලාශය ඉදිකිරීමේ කටයුතු ඇරඹේ.
- රුපියල් මිලියන 950 ක වියදමින් මහවැලි කෘෂි නිෂ්පාදන අලෙවිය සඳහා ඉදිකරන වෙළෙඳ මධ්‍යස්ථාන 3ක් මේ වසරේ නිම කිරීමට නියමිතය.



- උඩවලව වම් ඉවුර අක්කර 30,000ක භූමි ප්‍රදේශයක සිදු කෙරෙන සංවර්ධන කටයුතු මගින් පවුල් 5300කට සෙත සැලසේ.
- මානව සම්පත් සංවර්ධන නව තාක්ෂණය හඳුන්වා දීම, කාන්තා සංවර්ධන කටයුතු වැනි ගොවි සුභ සාධන කටයුතු සඳහා බහුකාර්ය මධ්‍යස්ථානයක් රුපියල් මිලියන 1700 වියදමින් ඉදිකෙරේ.
- ලෝක බැංකු ආධාර යටතේ රුපියල් මිලියන 3698ක වියදමින්, ගොවි පවුල් 30,000 කට සෙත සැලසෙන එච් කලාපයේ ඇල පද්ධති පුනරුත්ථාපන කටයුතු අරඹා ඇති අතර 2004 දී නිම කිරීමට යෝජිතය.
- ත්‍රස්තවාදී උවදුරු නිසා ඇණහිට තිබූ මාදුරුඔය දකුණු ඉවුර සංවර්ධනය ආරම්භ කොට ඇති අතර මේ යටතේ මඩකලපු දිස්ත්‍රික්කය හෙක්ටයාර් 14,000 කට වාරි ජල පහසුකම් සැපයේ.

- රුපියල් මිලියන 845ක සෞදි අරාබි ආධාර සහිතව මහවැලි බී කලාපයේ වම් ඉවුරු ඇල සංවර්ධනය කිරීමෙන් වාරි ඉඩම් හෙක්ටයාර් 1200කට සෙත සැලසේ.
- රුපියල් මිලියන 625ක යුරෝපා ආර්ථික හවුලේ ආධාර ඇතිව මහවැලි සී හා ජී කලාපයන්හි වාරි පද්ධති පුනරුත්ථාපනය කෙරේ. මෙමගින් නව වාරි ඉඩම් හෙක්ටයාර් 4500ක් සංවර්ධනය කෙරේ.



- රුපියල් මිලියන 1868ක වියදමින් සී කලාපයේ ඇරඹෙන තිරසාර සංවර්ධන ව්‍යාපෘතිය මගින් කෘෂි ව්‍යාපෘති සේවා, යන්ත්‍රෝපකරණ හා ගබඩා වැඩි දියුණු කෙරේ.
- හුරුළුවැව වාරි මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ඇල මාර්ග හා එහි ව්‍යුහයන් ප්‍රතිසංස්කරණය කිරීම අරඹා ඇති අතර එමගින් හෙක්ටයාර් 4000 කට වාරි පහසුකම් සැළසේ.
- අනවසරයෙන් ජලය ලබාගන්නා ගොවීන් සඳහා ජල සැපයුම් විධිමත් කොට සංවර්ධනය කෙරේ.

**මහවැලි ව්‍යාපාරයේ නවතම ව්‍යාපෘතිය වන මොරගහකන්ද යෝජනා ක්‍රමය ඇරඹීමේ කටයුතු සිදුවෙමින් පවතී.**

# ලක්ෂයකට වෘත්තීය පුහුණුව

- කුසලතා සංවර්ධන අරමුදල සඳහා අයවැයෙන් වෙන් කරන ලද මුදල රුපියල් මිලියන 100කි.
- වෘත්තීය පුහුණු පාඨමාලාවල ගුණාත්මක භාවය වර්ධනය කර ගැනීම සඳහා පුහුණු ආයතනවලට රුපියල් මිලියන 45ක් වැය කෙරේ.



- ජනාධිපති කාර්ය සාධක බලකායේ මඟ පෙන්වීම යටතේ පුහුණු වැඩ සටහන් දිවයින පුරා ව්‍යාප්ත කිරීම සඳහා රුපියල් මිලියන 10ක් වැය කෙරේ.
- 1994 දී 29ක් වූ කාර්මික විද්‍යාල සංඛ්‍යාව 36 කින් වැඩිවේ. දුෂ්කර ප්‍රදේශ සඳහා අනුබද්ධිත කාර්මික ආයතන 6ක් පිහිටුවේ.
- කාර්මික අධ්‍යාපනය ලබන සිසුන්ගේ ශිෂ්‍යත්ව හා ශිෂ්‍ය දෛනික දීමනා ලෙස රුපියල් මිලියන 60ක් සපයා ඇත.
- පාසල් සිසුන් සඳහා "නවොදව" නමින් වෘත්තීය මාර්ගෝපදේශන වැඩ සටහනක් දිස්ත්‍රික් මට්ටමෙන් ක්‍රියාවට නැගේ.

**වෘත්තීය පුහුණුව සඳහා පෞද්ගලික අංශයේ සහාය ලබා ගැනීම විශේෂයෙන් සඳහන් කළ යුත්තකි.**

සමාජ සේවා
අමාත්‍යාංශය

# සමාජ ආරක්ෂණ හා විශ්‍රාම වැටුප් ක්‍රමයක්

- ප්‍රජා මූලික ආබාධිත පුනරුත්ථාපන වැඩසටහන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 125ක ක්‍රියාත්මකයි. හඳුනාගත් ආබාධිතයින් 30,000ක් ප්‍රජාව තුළම පුනරුත්ථාපනය කර ඇත.



- "කැපකරු දෙගුරු" හා "සේවක සරණ කැපකරු" වැඩ සටහන් මගින් රැකවරණ නොමැති දරුවන්ට ආධාර ලබාදීමේ වැඩ පිළිවෙලක් ආරම්භ කෙරේ. පසුගිය හෑ වසර තුළ ප්‍රතිලාභි ළමුන්ගේ සංඛ්‍යාව 5525යි.

- ආබාධ සහිත පුද්ගලයින්ගේ සුභ සිද්ධිය උදෙසා ජාතික ලේකම් කාර්යාලයක් පිහිටුවේ. 1998/99 වසර දෙකේදී පමණක් මෙමගින් ප්‍රතිලාභ ලැබූ සංඛ්‍යාව 21756කි.

- වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 09 කදි විවිධ වෘත්තීන් 30කට අදළ පුහුණුව ආබාධිත පුද්ගලයන්ට ලබාදීමේ වැඩ පිළිවෙලක් ආරම්භ විය. ගත වූ කාලය තුළ මේ සඳහා රජය වැය කළ මුදල රුපියල් මිලියන 2.3ක් වේ.

- විපතට පත් කාන්තාවන් පුනරුත්ථාපනය කොට ඔවුන්ගේ පවුල්වල ජීවන තත්ත්වය නගා සිටුවීම සඳහා ස්වයං රැකියා හඳුන්වාදීමට පියවර ගෙන ඇත. 1995 සිට මේ දක්වා නොමිලේ ලබාදුන් මහන මැෂින් සංඛ්‍යාව 2026කි.



- වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන නවීකරණය කිරීමට හා ආබාධ සහිත ළමුන් පුනරුත්ථාපනය කිරීමේ පුහුණු මධ්‍යස්ථාන ඉදිකිරීම වෙනුවෙන් වැය කර ඇති මුදල රුපියල් මිලියන 30කි.
- දෘශ්‍යාබාධිතයින්ගේ උන්නතිය සඳහා භාරකාර අරමුදලක් ආරම්භ කෙරේ. රජය මේ සඳහා වාර්ෂිකව රුපියල් දස ලක්ෂයක බැගින් වූ ආධාර මුදලක් ලබාදේ.
- අඩු ආදායම් ලාභීන්, ස්වයං රැකියාවල නියුතුවූවන් සහ විශ්‍රාමිකයින් සඳහා සමාජ ආරක්ෂණ හා විශ්‍රාම වැටුප් ක්‍රමයක් ස්ථාපිත වේ.
- රාජ්‍ය නොවන සංවිධාන විධිමත් කිරීමේ අරමුණින් එම කටයුතු සම්බන්ධීකරණය සඳහා ලේකම් කාර්යාලයක් පිහිටුවේ.

**ආබාධිතයින් ප්‍රජාව තුළම පුනරුත්ථාපනය කිරීමේ නව වැඩ පිළිවෙල ක්‍රියාවට නැගේ.**

වනිතා කටයුතු
අමාත්‍යාංශය

# ආයෝජන කලාපවල කාන්තාවන්ට සහන

- එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන යටතේ වනිතා කටයුතු ශක්තිමත් කිරීමට රුපියල් මිලියන 23 ක් වැය කෙරේ.

- දරු උපතකදී මවට හිමිව තිබූ දින 7 ක් වන ප්‍රසූත නිවාඩුව දින 42 දක්වා වැඩි කර ඇත.



- කාන්තාව ආර්ථික වශයෙන් ශක්තිමත් කිරීමට ස්වයං රැකියා සඳහා ලබාදෙනු ලබන ණය වෙනුවෙන් අය කෙරෙන පොළිය 18% සිට 8% දක්වා අඩුකර ඇත.

- කාන්තාවන්ට ත්‍රිරෝද රථ ලබාදීමේ ව්‍යාපෘතිය යටතේ දැනට ලබා දී ඇති ත්‍රීරෝද රථ ගණන 22 කි.

- පරිගණක පුහුණු කිරීමේ පාඨමාලා ස්වයං රැකියාවක් ලෙස හඳුනාගෙන, කාන්තාවන් 12 කට පරිගණක ලබාදීම.

- 1999 දී කාන්තාවන් සඳහා ලංකා බැංකුව යටතේ 'රන්දිවි' ණය යෝජනා ක්‍රමය ආරම්භ කෙරිණි.

- විවාහවීමේ වයස අවුරුදු 16 සිට අවුරුදු 18 දක්වා වැඩි කිරීම.

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය



- ස්ත්‍රී දූෂණය සඳහා ලබාදුන් අවුරුදු 05ක උපරිම සිර දඬුවම අවුරුදු 15 දක්වා වැඩි කිරීම.

- දිවයින පුරා පොලිස් ස්ථාන 34 ක කාන්තා සහ ළමා අපරාධ අංශ පිහිටුවා ඇත.



- ආයෝජන කලාප තුළ සේවයේ නියුතු කාන්තාවන්ට සහන සැළසීම පිණිස උපදේශන මධ්‍යස්ථාන 5ක් රත්මලාන, කොග්ගල, බියගම, කටුනායක සහ රත්නපුරයේ පිහිටුවන ලදී.

- කාන්තාවන් සමාජීය හා ආර්ථික ශක්තිය තහවුරු කිරීම අරමුණු කර ගනිමින් දිවයින පුරා ලියාපදිංචි කරන ලද කාන්තා සමාජ ගණන 3240කි. ප්‍රාදේශීය බල මණ්ඩල ගණන 94කි.

- පෙර පාසල් ලියාපදිංචි කිරීම හා දිවයිනේ 8024 ක් පෙර පාසල් පාලිකාවන් ලෙස 8024 දෙනෙකු පුහුණු කිරීම

- ප්‍රාදේශීය වශයෙන් කාන්තාවන්ගේ ගැටළු විසඳීම සඳහා ප්‍රථම වරට ජංගම කාන්තා උපදේශන සේවාවක් අරඹන ලදී.

**වනිතා කටයුතු ශක්තිමත් කිරීමටත්,**
**සුරක්ෂිත කිරීමටත් පියවර ගැනේ.**

වතු යටිතල පහසුකම්
අමාත්‍යාංශය

# වතු කම්කරුවන්ගේ ජීවන මට්ටම ඉහළට

- විවිධ යෝජනා ක්‍රම 35ක් යටතේ වතු නිවාස 11037කට ද විදුලිය සපයා ඇත.
- වතු පාසැල් 200කට පුස්තකාල පොත් ද, පාසැල් 115කට කාර්යාල උපකරණ ද, පාසැල් 200කට ප්‍රාථමික අධ්‍යාපන උපකරණ ද සපයා ඇත.



- වතු කම්කරුවන් වෙනුවෙන් සංස්කෘතික මධ්‍යස්ථාන 5ක්, නිවාස 651ක් හා තැපැල් කාර්යාල 46ක් ඉදිකර ඇත.
- ක්‍රීඩාංගන 31ක වැඩ සම්පූර්ණ කර ක්‍රීඩා සමාජ 54කට ක්‍රීඩා උපකරණ ලබා දී ඇත.
- වතුකරයේ නව පානීය ජල සැපයුම් ව්‍යාපෘති 30ක් ද, ප්‍රජා ශාලා 40ක් ද ඉදිකරමින් යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමට පියවර ගෙන ඇත.
- නව වතු රෝහල් 15ක ඉදිකිරීම් ආරම්භ ඇත.

**විදුලිය, අධ්‍යාපනය, පානීය ජලය සැපයීමට දක්වන ප්‍රමුඛතාවය මගින් වතුකරයට පුනර්ජීවයක්.**

පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය

# සාමුහික ප්‍රතිපාදන මිලියන ගණනින් වැඩිවේ

- පළාත් සභාවල පුනරාවර්ථන වියදම් සඳහා සාමුහික ප්‍රතිපාදන යටතේ 1994 දී වෙන්කළ රුපියල් මිලියන 12,852 ක් වූ මුදල 2000 වර්ෂයේදී රුපියල් මිලියන 23,322 දක්වා වැඩිකර ඇත.



- 1994 දක්වා පළාත් සභාවන්හි සංවර්ධන කටයුතු සඳහා වාර්ෂිකව වෙන්කළ රුපියල් මිලියන 1000ක මුදල 2000 වසරේදී රුපියල් මිලියන 3000 දක්වා වැඩිකර ඇත.
- මධ්‍යකාලීන ආයෝජන වැඩසටහන යටතේ පළාත් සභා සඳහා 2000 වසරට පමණක් රුපියල් මිලියන 6338ක් ලබා දී ඇත.
- කසල අපහරණය කාර්‍යක්ෂමව ඉටුකිරීම සඳහා කොළඹ හා තදාසන්න ප්‍රදේශවල පළාත් පාලන ආයතන වෙත ජපන් ආධාර යටතේ යෙන් මිලියන 528ක වියදමින් වාහන යන්ත්‍ර සූත්‍ර හා තාක්ෂණ දැනුම ලබා දී ඇත.
- පළාත් පාලන ආයතන සඳහා සහනදායී කොන්දේසි මත 1994 දී ලබා දුන් රුපියල් මිලියන 23.3ක ණය ප්‍රමාණය 1999 වන විට මිලියන 50 දක්වා වැඩිකර ඇත. එය 2000 වසරෙදි රුපියල් මිලියන 100 දක්වා වැඩි කිරීමට අපේක්ෂිතය.

**පළාත් පාලන ආයතනවල යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමට පසුගිය සමයේ ලබාදුන් දායකත්වය කැපී පෙනේ.**

සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය

# ග්‍රාමීය සංවර්ධනයට වැඩි වැඩියෙන් මුදල්

- ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන හා ප්‍රාදේශීය ආර්ථික ප්‍රවර්ධන කටයුතු සඳහා පසුගිය වසර 6 තුළ රුපියල් මිලියන 8386ක් ආයෝජනය කෙරේ.



- ආසන මට්ටමේ සංවර්ධන කටයුතු සඳහා විමධ්‍යගත අයවැයෙන් මන්ත්‍රීවරුන් සඳහා වෙන් කෙරුන මුදල රුපියල් ලක්ෂ 25 සිට ලක්ෂ 50 දක්වා වැඩි කරන ලදී.
- ජර්මානු තාක්ෂණ ආධාර යටතේ රුපියල් මිලියන 520ක් ත්‍රිකුණාමල දිස්ත්‍රික් සංවර්ධන කටයුතු සඳහා වැය කෙරේ.
- නෝරාඩ් ආධාර යටතේ මඩකලපුව සංවර්ධන හා පුනරුත්ථාපන කටයුතු සඳහා රුපියල් මිලියන 572ක් ආයෝජනය කොට ඇත.
- 1999 - 2004 කාලය සඳහා සියළුම අමාත්‍යාංශවල ප්‍රමුඛතා පදනමින් සය අවුරුදු සැලැස්මක් ක්‍රියාත්මක කරන ලදී.

**ආර්ථික සම්පත් කාර්යක්ෂමව හා ඵලදායීව යොදාගනිමින් ග්‍රාමීය සංවර්ධනයට වැඩි අවධානයක්.**

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

වන සම්පත් හා පාරිසරික
අමාත්‍යාංශය

# වන සම්පත් සුරැකීමට ජාතික ප්‍රතිපත්තියක්

- වන සම්පත සුරැකීමට හා ඵලදායී ලෙස යොදා ගැනීමට වන සම්පත් පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සැකසේ.
- ආසියානු සංවර්ධන බැංකු ආධාර යටතේ රුපියල් මිලියන 3176ක අයෝජනයකින් වන සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය ඇරඹිණි.




- වනාන්තරවල ආරක්ෂාව සහ ව්‍යාප්ති කටයුතු සඳහා ක්ෂේත්‍ර සහකරුවන් 1500ක් අළුතින් බඳවා ගනු ලැබීය.
- ජලමාර්ග අපවිත්‍රවීම අවම කර පිරිසිදුව තබා ගැනීම අරමුණු කරගත් පවිත්‍ර ගංගා වැඩ සටහනෙහි නියමු ව්‍යාපෘතිය කැලණි ගඟ ආශ්‍රිතව දැන් ක්‍රියාත්මකයි.
- ඉහළ ජලධාරා කළමනාකරණ ව්‍යාපෘතිය මගින් වනාන්තර ආරක්ෂා කිරීම හා තෘණ බිම්වල පාංශු ඛාදනය අවම කිරීම සඳහා යෝග්‍ය වගා ක්‍රම පිළිබඳ මහජනතාව දැනුවත් කිරීම.
- අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කර පළාත් පාලන මට්ටමින් ක්‍රියාත්මක කිරීමට විධි විධාන යෙදේ.

**ග්‍රාමීය ජනතාවගේ ආර්ථිකය නගා සිටුවීම සඳහා
වන සම්පත් පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක්**

# පළාත් මට්ටමේ ව්‍යාපෘති රැසක්

- 1994 සිට මේ දක්වා සමුපාකාර මගින් රුපියල් මිලියන 360ක වියදමින් වී මෙ. ටො. 34854ක් මිලදී ගෙන ඇත.
- පෝෂ්‍යදායී සහල් ව්‍යාපෘතිය මගින් වී මෝල් 135ක් ක්‍රියාත්මක කොට අලෙවි කරන ලද සහල් ප්‍රමාණය මෙ. ටො. 44,041ක්.



- සමුපකාර බීජ වී ව්‍යාපෘති 16ක් තුළින් බීජ වී මෙ. ටො. 7048ක් නිපදවීය.
- කිරි නිෂ්පාදන සමිති හරහා ගතවූ සය වසර තුළ කිරි ලීටර් මිලියන 36.8ක් මිලදී ගෙන ඇත.
- ග්‍රාමීය බැංකු ශාඛා දිවයින පුරා 1361ක් ක්‍රියාත්මක කළ අතර තැන්පතුවල වටිනාකම රුපියල් මිලියන 44.2කි.
- විවිධ සේවා සමුපකාර සමිති 306ක් යටතේ ප්‍රාදේශික 7468ක් හා තොග ගබඩා 669ක් මේ දක්වා ක්‍රියාත්මක කර ඇත.
- මුහුදුබඩ හා මිරිදිය ජලාශ ආශ්‍රිතව ධීවර සමුපකාර සමිති 747ක් ක්‍රියාත්මක වන අතර සාමාජිකයින් 98,000කට පමණ මිත් සෙත සැළසේ.

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය



- සමුපකාර ක්ෂේත්‍රයේ මානව සම්පත් සංවර්ධනය කිරීම සඳහා සමුපකාර විද්‍යාලයට පරිගණක පහසුකම් සහිත නව තාක්ෂණය හඳුන්වා දෙන ලදී.
- සමුපකාර සමිති සාමාජික සාමාජිකාවන්ගේ දරුවන් සඳහා රුපියල් මිලියන 30කට ආසන්න මුදලක් වැයකරමින් සරසවි ශිෂ්‍යත්ව හා පහ වසර ශිෂ්‍යත්ව ලබා දී ඇත.



- සමුපකාර ව්‍යාපාරය පසුගිය කාලය තුළ අතිරේක බෝග නිෂ්පාදනයට සම්බන්ධ වෙමින් විවිධ ධාන්‍ය වර්ග මෙ. ටො. 441ක් නිපදවා ඇත.
- ජාතික ප්‍රවාහන පද්ධතියට සහාය වෙමින් බස් රථ 19ක් ද උතුරු නැගෙනහිර ජනතාවට ආහාර ද්‍රව්‍ය බෙදාහැරීම සඳහා ලොරි 17ක්ද සමුපකාර සමිති වලට ලබා දී ඇත.
- 1994 දී රුපියල් මිලියන 20,705ක් වූ සාමාන්‍ය වාර්ෂික වෙළෙඳාම මේ වනවිට රුපියල් මිලියන 26,750 දක්වා වැඩි වී ඇත.

**අකර්මන්‍යව තිබූ සමුපකාර සේවාව විවෘත ආර්ථිකයේ අභියෝග ජයගනිමින් යළි ස්ථාපිත වේ.**

උතුරේ පුනරුත්ථාපන
අමාත්‍යාංශය

# උතුරේ පුනරුත්ථාපනය වේගවත් වේ

- 1996 දී උතුරේ නැවත පදිංචි කරවීමේ හා පුනරුත්ථාපනය කිරීමේ අධිකාරිය පිහිටුවීම.
- සිවිල් පරිපාලනය ස්ථාපිත කොට ඇති යාපනය, වවුනියාව හා මන්නාරම දිස්ත්‍රික්කවල සංවර්ධනය වෙනුවෙන් 1996 සිට 2000 ජුනි දක්වා වැය කළ වියදම රුපියල් මිලියන 1282කි.



- 1997 සිට මේ දක්වා උතුරේ යටිතල පහසුකම් සැපයීම මූලික කොටගත් සංවර්ධන කටයුතු සඳහා රුපියල් මිලියන 920ක් යොදවා ඇත.
- යාපනය, වවුනියාව හා මන්නාරම වැනි දිස්ත්‍රික්කවල කුඩා හා මධ්‍යම ව්‍යාපෘති 960 ක් ක්‍රියාත්මක අතර ඒ සඳහා ලැබුණු විදේශ ආධාර ප්‍රමාණය රුපියල් මිලියන 239 කි.
- උතුරු ප්‍රදේශවල බලවත්සේ විපතට පත් මහජනතාව වෙනුවෙන් ගෙවනු ලබන වන්දි ක්‍රමය යටතේ මරණ හා තුවාල ලැබුවනට ලබා දී ඇති මුදල රුපියල් මිලියන 80කි.
- යාපනය, මුලතිව් හා කිලිනොච්චි දිස්ත්‍රික්කවල අවතැන්ව සිටි පිරිසෙන් 2000 අප්‍රේල් වනවිට 67000ක් පමණ නැවත පදිංචි කර ඇත.

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය



- 1996/1997 තුළ දී යාපන අර්ධද්වීපයේ මහ කන්නයේ වී වගාවට අවශ්‍ය බිත්තර වී බුසල් 35000 ක් (මෙ. ටො. 17.5) ආහාර හා කෘෂිකර්ම සංවිධානය මගින් සැපයීම.

- ගොවි හා ධීවර පවුල් 2000කට බීජ, ගොවි උපකරණ හා ආම්පන්න මිලදී ගැනීමට ආහාර හා කෘෂිකර්ම සංවිධානය මගින් ඇමරිකානු ඩොලර් 32,000ක ආධාර සපයා ඇත.



- නෝර්වේ ආධාර යටතේ ඇමරිකානු ඩොලර් ලක්ෂ 3ක ගොවි උපකරණ හා එළවලු බීජ උතුරේ ගොවි පවුල් 20,000කට ලබා දෙනු ලැබීය.

- උතුරු ප්‍රදේශයන්හි මිලියන හතකට ආසන්න පිරිසකට නොමිලේ ආහාර සලාක ලබාදේ.

**උතුරු නැගෙනහිර ජනතාවගේ සාමාජීය හා ආර්ථික සංවර්ධනයට ස්ථිරසාර වැඩ පිළිවෙලක්.**

"එක් පැත්තකින් මිනීමරු එල්. ටී. ටී. ඊ. යේ
ත්‍රස්තවාදී යුද්ධයට එරෙහිව අපේ රජය පැහැදිලිව,
ඍජුව හා ශක්තිමත්ව සටන් කරන බව
මා නැවත වතාවක් මේ සභාවට මතක් කරනවා.
අප එල්. ටී. ටී. ඊ. යට අවි ආයුධ දෙන්නේ නැහැ.
අප එල්. ටී. ටී ඊ. ය හොරෙන් ගෙනල්ල හෝටල්වල
තියාගෙන ඔවුන් සමග හොර සාකච්ජා කරන්නේ
නැහැ. මැතිවරණ යුගයන් වලදී
එල්. ටී. ටී. ඊ. ය සමග හොර සන්ධාන ගහගෙන
අපේ විරුද්ධවාදීන් මරවන්නට අප කවදවත්
කටයුතු කරල නැහැ.

1983 කලු ජුලියේ සිට වසර දහ අටක් තිස්සේ
අපේ රටේ ජනතාවගේ ජීවිත විනාශ කරපු යුද්ධය
නිම කිරීමේ පළමු හා තිරසාර පියවර අද මේ
ව්‍යවස්ථාව ඉදිරිපත් කිරීමෙන් අප ඉටු කරන්න
බලාපොරොත්තු වෙනවා."

2000 අගෝස්තු 03 දින
ගරු ජනාධිපතිනිය
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේදී.